

# අම්බලම

## නවාතැනකින් ඇරඹූ කතාවක්...

ඩබ්.ජී.සේසතිනි දිල්මිණි යාලිංගසිංහ

# අම්බලම

## නවාතැනකින් ඇරඹූ කතාවක්...

ඩබ්.ජී. සේසතිනි දිල්මිණී යාලිංගසිංහ

**නිකුත් කල දිනය ඃ-**

**පළමු පිටපත**
2023/11/15

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුෂලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුකරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# කතුවැකිය

මා ඓතිහාසික කතා කියවීමට මහත් වූ රුචිකත්වයක් දක්වූයේ කුඩා කල සිටමය. කොරෝනා අර්බුදයක් සමඟ මෙතෙක් නොකියව මා සතුව තිබූ ඓතිහාසික පොත් ගණනාවක් කියවීමට මා හට අවස්ථාව උදා විය.

යටත් විජිතකරණය තුලින් ගැලවී මෙරටට නිදහස ලද කාල පරිච්ඡේදයට පසුව මෙරට ජන සමාජයේ ඇති වූ වෙනස්කම් මෙම කෘතිය තුලින් නිරූපිතය. මා කියවූ ඓතිහාසික තොරතුරු ඇතුලත් ග්‍රන්ථවල සඳහන් යම් යම් තොරතුරු අනුව අදහස් කළපා මෙවැනි කෘතියක් රචනා කිරීම මා ලද ජයග්‍රහණයක් යැයි මා සිතමි.

මෙය මා රචනා කළ ග්‍රන්ථ අතර වන මුල්ම ග්‍රන්ථයකි. මෙහි කිසියම් අඩුපාඩුවක් වෙතොත් මා එය නිහතමානිව භාර ගනිමි. තවද මෙය මා විසින් රචනා කල කෘතියක් බවත්, මෙය සත්‍ය සිදුවීමක් නොවන බවත්, සලකන්න. ඉතියෙන් මාගේ මුල්ම නවකතා ගොන්නෙහි තවත් එක් අංකුරයක් වන 'අම්බලම' නවකතාව රස විඳීමට මෙලෙස පාඨක ඔබට මංපෙත් විවර කර සිටිමි.

මීට,

සේසතිනි දිල්මිණී යාලිංගසිංහ
2020-05-10

# පිදුම

***ආදරණීය අම්මාටත්,***

***අප්පච්චිටත්,***

***නිලුක්ෂි රාජපක්ෂ ගුරු මෑණියන්ටත්***

***සෙනෙහසින් පුදමි......***

# ආරච්චි මැණිකේගේ හතර මහා නිධානය

''අක්කණ්ඩි මොකෝ මේ උඹේ හතරමහා නිධානෙ අවුසන්නේ'' ආරච්චි මැණිකෙගේ මළණුවන්, ඇගේ කාමරයට එබෙමින් විමසූවේය.

''මළයන්ඩි උඹ මෙහේ?''

''ඔව් අක්කණ්ඩි මං මේ රාජකාරි කටයුත්තකට ආ ගමන් මෙහෙටත් ගොඩවෙලා යන්න හිතුවා.''

''මළයන්ඩි උඹ ආ එක හොඳා මං මේ නගණ්ඩියට දෙන්ට රෙදි පෙරෙදි ටිකක් තෝරනින් ගමන් යමන්කෝ තේ ඩිංගිත්තක් බීලා සප්පායම් වෙන්ට'' ආරච්චි මැණිකේ අලුමාරියේ දොර වසන අතරේ කීවාය.

''හැබෑට, ඒකි උඹේ රෙදි පෙරෙදි ඉල්ලන්ට තරම් හිඟන්නියක වෙලා ද අක්කණ්ඩි''

''එකී මගෙන් ඉල්ලුම කෙහෙම්මලක් නෑ බං එකී අඳින කඩමලු දැක්කම, මටම හිතිල නෙවැ මං මේ මේවා දෙන්ට තනන්නේ. මොනවා උණත් එකී අපේ එක බඩවැල කඩන් ආපු නඟන්ඩි නෙවැ මලයන්ඩි බැහැට උඹලගේ අමනාපකම් කවද්ද ඉවරයක් කර ගන්නේ?''

''කෝ අක්කණ්ඩි පුතණ්ඩියයි, අයියණ්ඩියි'' ඔහු කතාව වෙතකට හරවමින් ඇසීය.

''නිලමේ නම් දියේ එබිලා එන්ට ගියා. පුතා නම් මෙලහකටත් අරූ එක්ක කරක් ගහනවා ඇති''

''අරූ ය කිව්වේ, නඟන්ඩිගේ පුතණ්ඩියාට ද?''

උඟ තමයි, මං මගේ අම්මා මුත්තා කාලේවත් දැකලා නෑ උඟ වගේ තක්කඩිවෙක්. මේ සුදු මහත්තුරුන්ගේ කාලෙ වුණා නම් උඟටත් යන්න වෙන්නේ එල්ලුම්ගස් තමයි. කොහොමද අපෙ එකත් කර දඬු උස් මහත් වෙනකොට කියන එකක් අහනවයැ.''

''අප්පගේ පුරුදු තමා පුතණ්ඩියටත් පිහිටලා තියෙන්නේ.''

''උඹේ උන් එක්ක තියෙන අමනාපය, එකී හොර තක්කඩියෙක් සහේටගත්තු එක නෙවැ. ඒ වුණත් ඒකිට ඒ තරම් වැරදිලත් නෑ නෙවැ.''

අක්කණ්ඩි ඒකිව තවත් සුද්ද කරනවනේ. ආරච්චිල අයියණ්ඩියි උඹයි උන්ට බංගලාවක් හදල දුන්නේ නැත්නම් මෙලහකටත් ඒකී පාරේ හිඟා කනව.''

''හරි හරි, නවත්තපන් ඔය ගෝරනාඩුව. අන්න අරූන දෙන්නා එනවා.'' ආරච්චිලා මැණිකේ ඈතින් පෙනෙන තුන්මන් හන්දිය දෙස නෙත් හෙලමින් කීවාය.''

********

දහතුන්වන වියේ පසුවන අනුර සහ සිරිමල් ඥාති සොයුරන් සේම අඹ යහළුවන් ද වූහ. ඔවුන් දෙදෙනාම පුරුදුව සිටියේ සෑමදාම පාසල් නිම වී නිවෙස් වෙත ගොස් සවසට වැව් ඉව්රේ කෙලි සෙල්ලම් කිරීමටය.

''සිරිමල්, ඇත්තද බං උඹ අබරං උන්දැලාගේ චිමිනි ලාම්පුවක් හොරකම් කලා කියන කතාව.''

''කවුද ඔය විත්තිය උඹේ කනේ තිබ්බේ.'' සිරිමල් කෝපාන්විත බැල්මක් හෙලමින් අනුරගෙන් විමසීය.

''කීව එකා වැඩක් නෑනේ. ඇත්ත කියපන්.''

''ඔව්''

''උඹට කී දොහක් කීවද මං ඔය හොර වැඩ නවත්තපන් කියලා.''

''මං මේවා කරන්නේ මගේ මනාපෙට නෙවෙයි අනුර, අප්පච්චි තරවටු කරන නිසා''

''උඹ පුංචි අම්මාට මේ බවක් කීවේ නැද්ද.''

''අම්මාට කිව්වට ගණන ගන්න එකක් යෑ.''එසේ කියූ ඔහු ආරච්චිල වලව්ව දෙස බලා සිටියේ මහසොහොන් අවතාරයක් දුටු තැනැත්තකු ලෙසිනි.

''මොකෝ සිරිමල් ?''

''මං ගොහින් එන්නම් අම්මා කිව්වා වේලපහෙන් එන්ටය කියල'' එසේ කියූ ඔහු වෙඩි කෑ ඌරකු මෙන්, දිවයන්නට විය. කාරණා කාරණා වටහා ගත් අනුව ඔහුට යන්නට දී වලව්ව දෙසට ඇදුණෝය. වලව්වට ගොඩ වැදුණු ඔහු කච්චිචියේ වාඩි ව උන් මාමණ්ඩිට වැඳ නමස්කාර කළේය.

''තුරුණුවන්ගේ ම සරණයි මා පුතාට. උඹ මේ තුන් මහට වඩාත් උස් මහත් වෙලා නෙවැ. මොකෝ බං අරූ මං දැකලා ආපිට හැරුණේ?''

''මං හිතන්නේ මාමණ්ඩිව දැකලා වෙන්නැති.''

''ඌ මට බය වෙන්ට මං මොකාද?''

''මලයණ්ඩි ! උඹ උදෑහනැක්කේ ද ආවේ ''ඔවුන්ගේ කතාබහට,වලව්වට පැමිණි අරච්චිලා ද හවුල් වූයේය.

''ඔව්'' අයියණ්ඩි, මෙච්චර කළුවර වෙනකල් උඹ දියේ එබී එබී හිටියද?''

''උඹේ කවටකම් තාම කෙළවරක් නෑ'' ආරච්චිල නිල මේ ඉස්තෝප්පුවට අවුත් කච්චියේ හිඳ ගනිමින් කීය.

''මං දියේ එබිලා ඒ වතාවෙම ගියා ගමේ එකාලගේ වැව් සුද්ද කරන වැඩේ බලන්ට. උඹට කියන්න වැදගත් කාරණාවක් තියෙනවා.''

''මොකක්ද අයියණ්ඩි?''

''ඊයේ අඹරං ගොයියා මට රා මුට්ටියකුයි, මස් පොදියකුයි ගෙනත් දුන්නා උඹ අද මෙහෙ ඉඳල හෙට උදෑහනැක්කෙම පලයන්'

''ඒක නම් හොඳා අයියණ්ඩි ගමන් මහන්සියවත් ඇරෙන්නේ නැතෑ අක්කණ්ඩිත් කිව්වා අද ඉඳලා යන්ටය කියලා.''

''පුතණ්ඩියෝ උඹ මේ වගක් අම්මගේ කනේ එහෙම තියන්නෑ හොඳ ද?''

''හොඳා අප්පච්චි'' එසේ කියූ ඔහු එතැනින් අතුරුදන් වූවේය.

********

පසුදා උදෑසනින්ම අනුර සුදු පැහැති කමිසයකින් සහ නිල් පැහැති කොට කලිසමකින් සැරසී කළු පැහැති සපත්තු ජෝඩුවක් පැලඳ පාසල් යාමට සූදානම් විය.

''පුතණ්ඩියා ගජරාමෙට ආයිත්තම් වෙලා නෙවැ.'' ආරච්චිල මැණිකෙගේ මලයණ්ඩි, ආරච්චිලා නිලමෙට කීය.

''මං නම් ඔය ඉස්කෝලේ යන වැඩේට ඒතරම් මනාපයක් නෑ මං කියලත් අකුරු සාස්තරේ උගත්තාය අට පාස් එකෙක්ව යෑ මොකෝ මට කියලත් වැරදිලා තියෙනවා යෑ. අනික මං නාකි වුණා දාට උඹට මේ ආරච්චිල පට්ටම දරන්න පුළුවන් නෙවැ. නේද මලයණ්ඩි.''

ඔහු ඊට කිසිදු පිළිතුරක් නුදුන්නේය.

''මං ගොහින් එන්නම් අම්මා.'' අනුර මවට පමණක් වැඳ පිට ගියාය.

''අර දැක්කද උගෙ මහන්තත්තකම.'' ආරච්චිලා, මැණිකේ දෙස බලමින් කීය. ''උඹ දැනගනින් අද තමයි උඹ ඔය යන ගමනේ අන්තිම දවස.''

********

මඳ දුරක් ඇවිද ගිය අනුර මදක් කනස්සල්ලට පත්ව සිටියේය. ඔහු ඉතා මුරණ්ඩු තීරණයක් ගත්තේය. වලව්වෙන් පැන යාමට ඔහුට සිත් විය. ආපසු හැරුණු ඔහු බැද්දට රිංගා ගත්තේ වලව්වට පසුපස දොරින් ඇතුළුවීමේ අදහසිනි. ඔහු හනික වලව්වේ පසුපස දොර වෙත පියමැන්නේය. කිසිවකු පේන අහලක නොවීය. වලව්වට ඇතුළු වූ ඔහු තම කාමරය වෙතට ඇතුළු විය. මුලින්ම ඔහු ඔහුට අවශ්‍ය රෙදි පෙරෙදි ද, එක්අහුකර තිබූ රුපියල් ශත ද පොදි බැඳ ගත්තේය. මේ සියල්ල විශාල බෑගයකට ඔබා ගත් ඔහු නැවතත් බැද්දට රිංගා ගත්තේය. පාසල් නිල ඇඳුම මාරුකරගත් ඔහු කිසිවකු මුලිච්චි වීමට පෙර කඩමණ්ඩිය වෙත ගියේ උදෑසනින් දුම්බර බලා පිටවන තැපැල් කරත්තය අල්ලා ගැනුමටයි. ඔහු කරත්තකරුවා වෙත ගියේය.

''ආයුබෝවන්ඩ මං තමුන්නැහෙට ගෙවන්නම් තමුන්නැහෙට බැයිද මාවත් මේ කරත්තෙන් දුම්බර එක්ක යන්න.''

ඔය ළමයා මට කීයක් ගෙවනවාද?''

''රුපියල් දහයක් සෑහෙයිද?''

''ආ එහෙනම්, කරත්තෙට නැගපන් ළමයා.'' ඔහු තරමක් කාරුණික ස්වරයෙන් පැවසීය. පෝනියන් විසින් ඇදගෙන ගිය කරත්තය එතරම් මන්දගාමී නොවීය. හුවක දුරක් ගමන් කරන තුරුත් කිසිවකුත් එකිනෙකා ඇමතුවේ නැත. ඔවුන් ගමන ආරම්භ කල මොහොතේ සිට වූයේ කිසිදු හැල හොල්මනක් නැතිවය.

''ළමයා ඔය ළමයට යන්න ඕන කොතෙන්ටද?''

''දුම්බර රේල්ලුව ගාවට'' කරත්තකරුවා එක්වර නැගූ ප්‍රශ්නයට ඔහු පිලිතුරු දුන්නේය.

''එහෙනම් හවස් වෙන්ට කලින් යත හැකියි.''

''හොඳා''

''මං මේ ඔය ළමයගෙන් මෙහෙම අහන්නේ, හොඳට ඇඳ පැලඳලා ඉන්න නිසා.'' කරත්තකරුවා පහත් ස්වරයෙන් කීය. ''කවුද ඔය ළමයගෙ අම්මා අප්පා.''

''මං මේ කොලොම්පුරේ පදිංචි ඇත්තෙක් ආයුබෝවන්ඩ මගේ අම්මයි, අප්පච්චියිගෙයි ගම් රටවල්කාරිය එහෙ.'' අනුර සිව්වන පන්සිල් පදය කඩමින් කීය.

''එහෙනම් හවස තුනේ රේල්ලුවෙන් යත හැකියි.''

*********

''නිලමේ' කොලුවා තාම ගෙදර ආවෙ නෑ නේද? ඉස්කෝලේ ඇරිලත් දැන් හෝරා දෙකක් විතර වෙනවා.''

''බය වෙන්ට කාරියක් නෑ. පුතා මීටත් වඩා ප්‍රමාද වෙලා ගෙදර ඇවිත් තියෙන්නේ.''

''අද පුතා ඉස්කෝලේ ගියේ ඒ තරම් හොඳ හිතකින් නම් නෙවේ. මයෙ හිතේ ඒකයි මගේ හිතට මේතරම් හැක.'' ආරච්චිල මැණිකේ කනස්සල්ලට කීවාය.

''අන්න සිරිමල් කොලුවා එනවා අහල බැලුවනන් ටිකක්.'' ආරච්චිල නිලමේ වැට කඩුල්ල ඔසවන සිරිමල් දෙස බලමින් කීය.

''සිරිමල් පුතා !''

''ලොකු අම්මේ, මොකෝ අද අනුර ඉස්කෝලේ ආවේ නැත්තේ?. මං මේ ආවේ ලෙඩක් දුකක් ද කියල බලලා යන්ට.''

''මොකක් කිව්ව ඉස්කෝලේ ආවේ නෑ.''

''ඔව් ලොකු අප්පච්චි.''

''අනේ මයෙ පුතා, නිලමෙ තමයි මේ හැමදේට වගකියන්ට ඕන.'' ආරච්චිලා මැණිකේ නිකටේ අත තියමින් හැඟුම්බර වන්නට විය.

''මැණිකේ නාඩා ඉන්ට. මං ඩිංගිත්තක් සෝදිසි කරල එන්නම්.''ආරච්චිල නිලමේ ලන්තෑරුම අතට ගනිමින් කීය. ''අපි එන්ට රෑ වෙන්ටත් ඉඩ තියෙනවා නෙවැ. යමන්කෝ සිරිමල් පුතා.''

''අපි ගොහින් එන්නම් ලොකු අම්මා නිස්කාරනේ බය වෙන්ට එපා.''

********

''බලපන්කෝ සිරිමල් පුතා. උදෑහනැක්කේ ඉස්කෝලේ යනවාය කියල ආපු එකා නෙවෑ බැහෑට උඹට මුලිච්චිවුනේ නැද්ද.''

''නෑ ලොකු අප්පච්චි. අද දවසටම දැක්කේ නෑ.''

''අපි දන්න කියන හැම තැනටම ගොහින් බලමු.'' ආරච්චිල නිලමේ පැවසුවේ වලව්ව දෙස හැරී බලමිණි.

********

දුම්බරට පැමිණි අනුර කරත්තකරුට ගාස්තුව ගෙවා රේල්ලුවෙන් කොළඹ කරා ගමන් ඇරඹීය. දීර්ඝ ගමනකින් අනතුරුව ඔහු කොළඹ ඉස්ටේසමට ළඟා විය. රේල්ලුවෙන් බැසගත් හෙතෙම රෑ බෝවී තිබූ බැවින් අසල වූ අම්බලමකට සේන්දු වී කුසගින්නේම නිදන්නට විය.

**අලුයම් දූරයේ මුණ ගැහුණු අමුත්තා**

අලුයම් දූරයේ යමක් බිමට ගිලිහෙල 'සලාන්' නදින් අනුර අවදි විය. වටපිට බැලූ ඔහුට දැකගත හැකිවූයේ කිසිසේත් බලාපොරොත්තු නොවූ අමුත්තෙකි. ඔහු බහතෝරන වියේදී දුටු පසු මෙවන් තැනැත්තෙක් දුටු මුල්ම අවස්ථාවයි මේ. බිම වැටී බිඳී ගොස් තිබුණේ රට බීම බෝතලයකි. මේ අමුත්තා සිංහලේ වැනසූ සුද්දෙකි. ඔහුව දුටු අනුර තිගැස්සී උඩ බිම බලන්නට විය.''

''අහා, ඔයා ළමයා බයවෙන්න එපා.'' ඔහු සිංහල නුහුරු ඉංග්‍රීසි උච්චාරණයෙන් දෙඩීය. අනුර අමුත්තාගේ මුවින් පිට වූ වදනින් මවිත විය.

ඔයව ළමයාගේ නින්දට ඩිස්ටර්බ් උනා නම් සොරි. මොකක්ද ළමයෝ ඔය ළමයාගේ නම'' අමුත්තා විමසීය. මං ඇහුව විදිය හරිනේද?''

''ඔව්, මම අනුර''

'' නයිස් නේම්''

ඔයා මට බයවෙන්න එපා. මං එංගලන්තෙ ඉපදුණාට මගේ මමී මේ රටේ කෙනෙක්. ඩැඩී එහෙදී මැරුණට පස්සේ මං ලංකාවට ආවේ.''

අනුර ඔහුගේ දෙඩුම හැකි අයුරින් වටහා ගත්තේය.

''හව් ඕල්ඩ්..නෝ'' ඔහු තම ඉංගිරිසි කතාව නවතා එය සිංහලයට ගැලපීමට තැත් කළේය.

''වයස, ඔයාගෙ වයස''

''අවුරුදු දහතුනයි.''

''වේට්'' එසේ කියූ ඔහු වැල්ලේ ඉලක්කමින් (13) යනුවෙන් ලියුවේය. අනුර හිස වනා එය පිළිගත්තේය.

''මයි සන්, ඔයාගේ වයස'' සුද්දා කීය.

''මයි සන් කීවේ මහත්තයෝ.'' අනුරට නොතේරුණු අපබ්‍රන්ස ඔහු විමසීය.

''පුතා මගෙ පුතා'' මදක් කල්පනා කල ඔහු පැවසීය. ''ඔයා කැමතිද අපේ ගෙදර එන්ට. මගෙ පුතාගෙ තනියට''

''තනියට?''

''යා එයාගේ මමී නෑ''. මං ඔෆිස් යනකොට එයා ගෙදර තනියම ඔයාට ඕන හැමදේම මං දෙන්නම්.''

''මට ඉස්කෝලේ යන්ට දෙනවා නම් මම එනවා''

''ස්කූල්'' අමුත්තා මදක් සිනා බැලීය. ''යස්, මයිසන් එක්ක යන්ට පුළුවන්.'' අනුර මදක් කුහුලින් සිනා බැලීය.

''ඔය ළමයා බය වෙන්ට එපා. ඔය බෑග් එක දෙන්ට.'' අනුරගේ සිතුවිල්ල වටහා ගත් ඔහු අනුරගේ ගමන් මල්ල අතට ගනිමින් කීය. ඔහු අනුරව කැටුව ගියේ වීදියේ නවතා තිබූ ඔහුගේ කාරය වෙතය. වංගියක් නුවර දළඳා පෙරහැර නැරඹීමට ගිය පසු මෙවන් කාරයක් අනුර දැක තිබුණ ද එහි අද ගමන් කරනුයේ මුල් වරටය. අමුත්තා කාරයේ දොර විවර කර පසු අනුර ඊට ඇතුළු විය.

නවීන පන්නයේ රෝද හතරේ රිය දෙස ඔහු විස්මයේ දෑස් දැල්වීය. අමුත්තා ඉදිරි අසුනේ අසුන්ගෙන රිය පනගැන්වීය. කාරය ඉදිරියට ඇදී යන්නට විය.

''ළමයා මට ඔයාට මාව අඳුන්වලා දෙන්ට බැරිවුණානේ.'' සුද්දා නුහුරු සිංහලෙන් දෙඩීය. මං ඩේවිඩ්, අන්කල් කියලා කථා කරන්නකෝ.

මං හිතනවා මගේ පුතාට සිංහල කතා කරන්ට ඔය ළමයා උදව් වෙයි කියලා.''

''ඇයි එයාට සිංහල කථා කරන්ට බැයිද?''

''හ්ම් යස්''

කාරය නොයෙකුත් වීදිවලින් හැරී පියඹා යන්ට විය. නගරය පුරා වීදි මිනිසුන්ගෙන් පිරී තිබිණි. මේ මහා කන්දොස්කිරියාවට තමා මුහුණ දෙන්නේ කෙසේ දැයි සිතමින් අනුර නගරය දෙස නෙත් හෙලන්නට විය.

කාරය නැවතත් වංගුවක් හැරී පන්සලක් පසුකර යන්නට විය.

''අර පෙනෙන්නේ මගේ බංගලෝ එක.'' ඩේවිඩ් කාරය අතුරු මගකට හරවමින් කීය.

''බංගලාව ද?'' අමුත්තා හිස වනා එය පිලිගත්තේය. කාරය බංගලාව වෙත ඇදී යාමට විය. කාරයේ නාදය ඇසීමෙන් දෝ බංගලාවේ සිට ඇතැමෙක් වසා තිබූ ගේට්ටුව වෙතට දිව එන්නට වූහ. ඔහු ගේට්ටුව විවර කළේය. කාරය විශාල උද්‍යානයක් මැදින් ගොස් පෝටිකෝව තුල නතර කෙරිණි. සුද්දා අනුරට කාරයෙන් බසින ලෙස සංඥා කළේය.

''මගේ සන් කෝ?'' ඔහු සේවකයන්ගෙන් ඇසීය.

''පොඩි මහත්තයා. උදේට සප්පායම් වෙනවා.''

''සිරිසෝම මේ මහත්තයාගේ බෑග් එක ගන්නවා. ඔහු අනුරගේ ගමන් මල්ල පෙන්වමින් සේවකයාට කීය. ''ළමයා, එන්න යමු ඇතුලට.''

## කොළොන්පුරේ බංගලාව

ඩේවිඩ් මහතා අනුරව බංගලාව තුලට කැටුව ගියේය.

''මයිසන්, මෙහාට එන්න'' තම ආදරණීය පියාණන්ගේ නියෝගයට බංගලාවේ ආලින්දයට ඔහුගේ පුත්‍රයා පැමිණියේය. ඔහු ද පියාණන් සේම ඉංගිරිසි කාරයෙකි.

'ඕ.. ඩෑඩ්'' ඔහුගේ පුත්‍රයා ඉංගිරිසියෙන් නොයෙකුත් දේ දොඩන්ට විය. පසුව ඔහු අනුර ඉදිරියට පැමිණ අත දිගු කළේය.

''හායි, අයිම් රොබින්'' අනුරට ඔහුගේ ඉංගිරිසි හරුපයන් නොතේරුණි. එය වටහාගත් සේවකයා ඔහුට කාරුණික වූයේය.

''පොඩි මහත්තයා, ඔය මහත්තයාව පිළිගන්නවා. එයාට අතට අත දෙන්ට'' ඔහු රහසින් දෙඩීය. අනුර ඔහු කී බස පිළිගත්තේය. අනුරට ලැබුණු නිදන කුටිය වලව්වේ ඔහුගේ කාමරයට සැප පහසුවිය. ඔහු වලව්ව ගැන සිතමින් උන්නේය. එක්වරම කුටියේ දොරටුවෙන් හඬක් නැගිණ.

''මහත්තයෝ මං ඇතුලට එන්නටද?''

කවුදැ මේ?''

''මං මේ සිරිසෝම.''

''කාරි නෑ, ඇතුලට එන්ට.'' ඔහු ඇතුලට පැමිණියේය.

''ආ කාරණේ කිව්වානම්''

''මට මහත්තයා එක්කලා ඩිංගිත්තක් කතා කරන්ට උවමනායි.''

කතිකාකර ගන්ට පෙරින් ඈඳි ගත්තානම්.'' අනුර ඔහු අසලින් හිඳ ගැනුමට සිරිසෝමට අණ කළේය. ඔහු ඇඳ මත අසුන් ගත්තේය.

''මට මහත්තයා ගැන දැනගන්ට උවමනායි. හැබැයි ඇත්තම උවමනායි. මං ගැන හැකයක් තියාගන්නට උවමනා නෑ. මහත්තයාගේ රහස් මං කාගේවත් කනේ තියන්නේ නෑ, දෙයියම්පා.''

''හොඳා...'' අනුර තමාගේ වතගොත සියල්ල ඔහුට හෙලි කළේය. ඔහු හා ආරච්චිලා නිලමෙගේ ආරවුල ගැනත් වලව්වෙන් පැන ආ සැටින් ඔහු කීවේය. සිරිසෝම ඒ සියල්ල අසා සිටියේ කනෙන් පමණක් නොව මුවද අයා ගෙනය.

''මගේ හැකේ නිවැරදි එහෙනම් මහත්තයාත් ඉහල පැලැන්තියෙන් පැවත ගෙන එන්නෙක් නෙවැ.'' එසේ කිවූ ඔහු හනික ඇඳෙන් නැගිට්ටේය.

''ආයුබෝවන්ඩ, ඔය ආචාර සමාචාර මෙහිදී නැතුවාට කාරියක් නෑ. මෙහෙන් ඈඳිගන්ට.''

********

අනුර කොළොන්පුරේ බංගලාවට පැමිණ දින ගණනක් ගත වුවද ඔහු සිටියේ නිදන කුටියට සීමා විය. නැවත වලව්වට යාමට සිත්වීද ඔහු එම අදහස අත් හරින්නට විය. ඔහුගේ සිත වූයේ වලව්ව පිළිබඳ වීද ඊට බාධාවූයේ කාමරයේ දොරට කිසිවෙක් තට්ටු කළ නිසාවෙනි.

''කවුද?' අනුර ඇසීය පිටතින් පිළිතුරක් නොවීය. ඔහු දොර විවර කළේය.

ඒ ඔහුගේ වයසෙහි ම වූ රොබින් ය. ඔහු අනුරට ඔහු සමඟ පැමිණෙන ලෙස අතින් සංඥා කළේය. ඔහු තෘෂ්ණීම්භූතව බලා සිටියේය. එබැවින් රොබින් ඔහුව ඇදගෙන ගොස් බංගලාවේ උද්‍යානය අසල නතර විය. සිරිසෝම ද කඩවීදියට ගොස් සිටි හෙයින් බංගලාවේ වූයේ ඔවුන් දෙදෙනා පමණි.

''කිරි අප්පොච්චියේ මේ පතරංග නාග රාජයෙක් නෙවැ.'' උද්‍යානයේ පඳුරක් යට දරණ ගසාගෙන සිටින නාග රාජයා දුටු අනුර උන්මත්තකයකු සේ දෙඩීය.

''රොබින් මහත්තයා පස්සට යන්ට'' ඔහු රොබින්ව පසකට තල්ලු කළේය. අනතුරුව බිමට නැමුණු ඔහු ඉතිපිසෝ ගාථාව සජ්ඣායනා කළේය. සුදු ජාතිකයෙකු වූ රොබින් අනුරගේ නමස්කාරය දැක දත් විලිස්සා කැකිරි පලන්නට විය. කෙසේ වෙතත් නාගරාජයා පෙනේ පාත හෙලා අකුලකට රිංගා ගත්තේය.

''රොබින් මහත්තයාට මේවා විහිළු!, මං නම් හිතන්නේ නෑ මේ ගම් තුලානේ එවුන්ට නයෙක් එලවාගන්නට හැකී කියලා.'' අනුර ලොකුකම් පෑවේ වංගියක් වලච්චට රිංගා ගත් නාගරාජයා අප්පච්චි එල වූ ආකාරය සිතින් මවා ගනිමිනි.

********

''ආ මං මේ සන්ව හොය හොයා හිටියේ.'' උද්‍යානයේ පොකුණකට හේත්තු වී වතුර කලත්තමින් සිටි අනුර දෙසට පැමිණෙමින් ඩේවිඩ් මහතා කීය.

''ඇයි අන්කල්?''

''මගේ සන්ව ඊයේ බේරගත්තාට තෑන්ක් කරන්නයි මං ආවේ. ඔයා කැමති දෙයක් මගෙන් ඉල්ලන්ට.''

''ඕනම දෙයක්,''

''යස් !''

''මට ඉස්කෝලේ යන්න ඕනේ.''

''ආ, ඒ දේ ගැනත් කියන්ටයි මං ආවේ.''ඔහු කීය ''මගේ සන්ට උගන්නන්ට ගවර්න්ස් කෙනෙක් එනවා. ඔයාටත් පුළුවන් එයාගෙන ඉගෙන ගන්ට. ෆෝ ඉයර්ස් එයාගෙන් ඉගෙන ගෙන ඔයා කැමති නම් ඔයාට පුළුවන් ටූ ඉයර්ස් යුනිවර්සිටි යන්ට.''

********

''සිරිසෝම මාමේ,'' අනුර ඔහුට හඬ ගසමින් මුළුතැන්ගෙය වෙත ගියේය.

''පුංචි නිලමේ''

''මෙන්න මේ වංගියේ මං පුංචි නිලමේ වෙලා.''

''එහෙම තමා ගරු නම්බු දීලා දොඩන කොට. කාරිණෑ පුංචි නිලමේ ආ කාරණේ.''

''ගවර්න්ස් කියන්නේ කවුද?''

''ඒ කියන්නේ, ගෙවල්වලට ඇවිදින් උගන්වන ගුරුවරුන්ට,''

''එතකොට ටූ ඉයර්ස්, ෆෝ ඉයර්ස් කියන්නේ.''

ටූ ඉයර්ස් කියන්නේ අවුරුදු දෙකක්, ෆෝ ඉයර්ස් කියන්නේ අවුරුදු හතරක්.''

''තව එකම එකක් ඇහුවට කාරි නැද්ද?''

''හොඳා''

''යුනිවර්සිටි කියන්නේ.''

''ඒ කියන්නේ විශ්ව විද්‍යාලයක්, මේ කාලේ හොඳට අකුරු සාස්තරේ උගත්හොත් ඔය නිලමෙටත් ගත හැකි හැබැයි විශ්ව විද්‍යාලේ යන්ට විභාග පාස් කරන්ට එපා යෑ ඊටත් මේ යුනිවර් සිටිය තියෙන්නේ එංගලන්තේ නෙවැ.''

''එංගලන්තේය කීවා!''

''හැබෑව, පුංචි නිලමේ.''

## බංගලාවේ ඉස්කෝලේ

''පුංචි නිලමේ එන්ට'' සිරිසෝම අනුරට හඬ ගෑවේ ගුරුතුමිය බංගලාවට පැමිණි නිසාවෙනි.

''මෙයාද ඩෙවිඩ් මහත්තයා කිව්ව දරුවා.'' ඇය කාරුණික ස්වරයෙන් විමසීය.

''එහෙයි! ලිලී නෝනා ?''

''මොකක්ද දරුවෝ නම ?''

''අනුර''

''ඇවිදින් මෙහෙන් වාඩිවෙන්ටකෝ'' ඇය අනුරට රොබින් අසල හිඳ ගැනීමට කීය. රොබින් ඔහු දෙස දෙනෙත් විසල් කරමින් බලා උන්නේය.

''ලිලී නෝනා, මං කඩවීදියට ගොහින් එන්නම්.''

''හොඳා'' ඇය කීය. ''රොබින්ට දැන් අලුත් යාළුවෙක් හම්බ වෙලා නේද?''

''යස් ටීචර්!''

අනුර පුතා වැඩිපුරම ආසා මොන විෂයටද?''

මං වැඩිපුරම ආස ගණිතයට ටීචර්.'' රොබින් ටීචර් කියා ඇමතූ බැවින් අනුර ද ඔහුව අනුකරණය කළේය.

''එහෙනම් අපි මැත්ස් ලෙසන් එකක් කරමු. මෙන්න මේ ගණන් දහය හදන්න. කවුද බලමු ඉස්සරෝම හදන්නේ.''

අනුරට ඔහුගේ ගමේ පාසල මතක් විය. පාසල තුල දී ඔහු පෙන් වූ දස්කම්, පන්තියේ පළමු වැනියා වූ සැටි, සිරිමල් සමඟ වූ අඬදබර ඔහුව අතීතයට ගෙන ගියේය. ඔහුට නොදැනීම ඔහුගේ අභ්‍යාස පොත කඳුලින් පෙඟෙන්නට විය. කඳුලින් පෙඟුණු පොත දුටු ඔහු පියව් සිහියට පැමිණියේය. අනුර රොබින්ටත් පෙරින් ගණන් දහයම සාදා නිම කළේය.

''ටීචර්''

ඔයා ඔක්කොම ටික හැදුවද?''

''ඔව් ටීචර්''

''කෝ දෙන්න බලන්ට'' ගුරුතුමියගේ මුහුණින් ප්‍රීතිමත් බවක් දිස්විය. රොබින් ඔයා හදල ඉවරද?'' ගුරුතුමිය විමසීය. රොබින් ගුරුතුමිය දෙසට ඔහුගේ පොත් දික් කළේය.

''අනුර පුතා හරි හපනානේ. ඔයාගේ ගණන් සේරම හරි.'' ඇය කීය. ''රොබින් ඔයාට නම් ටිකක් මහන්සි වෙන්ට වෙයි. ඔයාගේ ගණන් තුනයි හරියි. එදා ඔයාට මේ ගණන හදන විදිය මං කියලා දුන්නා නේද?''

රොබින් ගුරුතුමිය දෙස බලා හිස සැලීය. අනතුරුව ඔහු අනුර දෙස විස්මයෙන් බැලීය.

********

''කොහොමද නෝනා පුංචි නිලමෙගේ වැඩ කටයුතු.''

''වරදක් නෑ සිරිසෝම, කොලුවා හරි දස්සයා.'' එසේ කියූ ගුරුතුමිය නැවතත් සිරිසෝම දෙස බැලීය. ''ඇයි සිරිසෝම අනුරට පුංචි නිලමේ කියන්නේ.''

''පුංචි නිලමේ නම් කීවා මේ වගක් කාගෙවත් කනේ තියන්ට එපාය කියලා.''

''කාරි නෑ, මං කාටවත් කියන් නෑ''

දිගු සුසුමක් හෙලූ සිරිසෝම අනුරගේ කතාන්දරය හැකි අයුරින් පැහැදිලි කළේය.

********

දවසින් දවස වසරෙන් වසර ගෙවී ගියේ ගඟෙන් ගෙඩි එන්නා මෙනි. අනුර කොළොම්පුරට පැමිණ සිව් වසරක් ගත වී ගොසින්ය. අනුර සෑම අතින්ම රොබින්ට වඩා පියවරක් ඉදිරියෙන් වූයේය. බංගලාවේ ඩේවිඩ් මහතා ද ඔහුට තමාගේම දරුවකු සේ සැලකීය. අනුර ද රොබින් ද සහෝදරයන් සේ පෙමින්, මිතුදමින් බැඳුනහ. අනුර ද ඉංගිරීසි මිශ්‍ර සිංහල බසින් කථා කිරීමට උගත්තේය. රොබින් ද නියම සිංහලයෙකු මෙන් නොවුවත් යම් තරමකින් සිංහල කතා කිරීමට හුරු වූයේය. ඒ ඔවුන් දෙදෙනාගේ මිතුදමේ ප්‍රතිඵලයක් ලෙසිනි.

අනුර තුල යම් සන්තාපයක් නොවූයේම ද නැත. ඔහුට නැවතත් ගමට යාමට සිතුණු අවස්ථා ද අනේකවරය. මව් සෙනෙහසින් හා පිය සෙනෙහසින් ආලෝකමත් වූ අතීතයේ මතකය ඔහුට සිහි වී තනිව හැඬූ අවස්ථා ද බොහෝ වූයේය. මෙතෙක් කලක් ගව් ගණනක් දුරින් දිවි ගෙවුවද දැන් ඔහුට උදා වී ඇත්තේ සිය මව්පියන්ගෙන් ද මව්බිමෙන් ද සයුරෙන් ද එහා නොදත් දේශයකට පිටව යාමටයි. ඒ ඔහුගේම අරමුණ නිසයි. විශ්ව විද්‍යාලයට යාමේ වරම් ලද ඔහු එංගලන්තය බලා පිටවීමට නියමිතය.

********

''අනුර වටායු ඩුයින්?'' අනුරගේ කුටියට පැමින රොබින් ඇසීය.

''මං මේ ගමට ලෙටර් එකක් ලියනවා.''

''ඔයා කවදාවත් ගමට ලෙටර් එකක් යවල නෑනේ?''

හ්ම්, එංගලන්තයේ යන එක ගැන ලියල යවන්ටයි යන්නේ?

''ඒක නම් හොඳ වැඩක්.'' රොබින් කීය. ''ඔයා ඉන්ග්ලන් ගියාම මටයි පාළුව''

''මං වැඩි කලකට නෙවෙයි නෙවැ යන්නේ.''

''අවුරුදු දෙකක් කියන්නේ ලොකු කාලයක්.'' ඔහු කීය. මං ඔයාගෙ ලෙටර් එක කියෙව්වාට කමක් නැද්ද?'' ලිපිය ලියා අවසන් කර කඩදාසිය දෙකට තුනට නැමූ අනුර දෙස බලා සිටි රොබින් ඇසීය.''

''හ්ම්, හරි කියවන්ට!'' අනුර ඊට එකඟ වූයේ ය.

1964.08.21
නො. 16,
බ්‍රවුන්රිග් බංගලාව,
කොළඹ.

ආදරණීය අම්මා වෙත,

මගේ ආදරණීය අම්මේ මේ ලියුම අප්පච්චිටත් කියවන්ට දෙන්න. මම මගේ අප්පච්චි එක්ක තරහා නෑ. මාව හොයාගෙන අපු නැති එකටත් මං තරහක නෑ. එදා මං ගත්තේ මුරණ්ඩු තීරණයක් වුණත් මට අද වැරදිලා නෑ. මේ ගෙවුණු අවුරුදු හතර පුරාවට මම බංගලාවේ ටීචර්ගෙන් ඉගෙන ගත්තා. විශ්ව විද්‍යාලයට යන්න විභාගය පාස් වුණා. විශ්වවිද්‍යාලය තිබෙන්නේ එංගලන්තේ ඒ හින්දා මං අවුරුදු දෙකකට එංගලන්තේ යනවා මං අනිද්දා කොළඹ වරායෙන් පිටත් වෙනවා. ලංකාවට කවදාහරි මං ආපු දවසක අනිවාර්යෙන් ගමට එන්ට මං පොරොන්දු වෙනවා. එදා වලව්වෙන් පැනල ආපු මං නොවෙයි එදාට එන්නේ. දැන් සමහර විට අම්මලාට මාව අඳුරගන්නත් බැරි වේවි. අම්මලා දුක්වෙන්ට කාරි නෑ. මං සතුටින් ඉන්නවා මාමණ්ඩිවත්, පුංචි අම්මාවත්, සිරිමල්වත් මං ආදරෙන් මතක් කලා කියන්ට අම්මලා මාව හොයන් කොළොම්පුරේ එන්නනම් එපා. එතකොට මං එන්ගලන්තේ ඉඳියි. මං කවදහරි ආපහු එන්නම්. එහෙනම් මං නවතිනවා.

අම්මලාට බුදු සරණායි !

මීට
ආදරණීය පුතා
අනුර

රොබින් ලියුම කියවා අවසන් කළේය.

********

අනුර පිටව යන දවස උදා වූයෙන් සියල්ලන්ම වරායෙහි වූහ. ''සිරිසෝම මාමේ මං ගොහින් එන්නම්.''

''පුංචි නිලමේට තුරුණුවන්ගේ සරණයි.''

''ඩේවිඩ් අන්කල් !'' අනුර ඔහුටද දනගසා වැන්දේය.

''ජේසු පිහිටයි! අනුර'' ඔහු හදවතින්ම අනුරට ආශිර්වාද කළේය.

''රොබින්!'' අනුර ඔහුට අතට අත දුන්නේය. ''පරෙස්සමින් ඉන්ට'' අනුර ඔහුව වැළඳගනිමින් කීය.

''පුංචි නිළමේ අන්න නැව පිටත් වෙන්ටයි සූදානම'' යාබඳින් වූ නැව පෙන්වමින් සිරිසෝම කීය.

''මං ගොහින් එන්නම්!'' තම බඩු බෑගය අතට ගත් ඔහු නැව දෙසට ගියේය. ඔහු නැවට ගොඩ වෙත්ම නෞකාව ඉදිරියට ඇදෙන්නට විය. අනුර සියල්ලන්ට ම අත වැනුවේ කඳුළු පිරි දෙනෙතිනි. ඔවුන් කුහුඹුවන් සේ පෙනෙන තෙක්ම අනුර ඔවුන්ට අත වැනීය.

********

''අක්කණ්ඩි මෙන්න මේ දැන් තැපැල් කාරයා උඹට දෙන්ටය කියල මේ ලියුම දීල ගියා. ආරච්චිල මැණිකෙගේ මළයන්ඩිය ඇයට හඬ ගැසීය. අනුර වලව්වෙන් පැන ගිය දවසේ සිට ආරච්චිලගේ හා මැණිකේ ගේ තනි නොතනියට වූයේ ඔහු පමණි. ඔහු වලව්වේ පදිංචියට ආවේය. ඇය ලියුම අතට ගෙන එදෙස තියුණු බැල්මක් හෙලීය.

ඇය ලිපිය කියවා අවසන් කළේ කඳුළු පිරි දෙනෙතිනි. ''නිලමේ'' මෙන්න මෙහෙට ඩිංගිත්තක් ආවා නම්.''

''මොකෝ මැණිකේ මේ කෑමොර දෙන්නේ?''

ආරච්චිල නිලමේ වලව්වේ මිදුලට පැමිණියේය. ඔහු ද අනුර එවූ ලිපිය කියවා බැලුවේය.

''මං මැණිකෙට කිව්වා නේද කොලුවා යහතින් ඉන්නවාය කියලා''

''මොකක් කිව්වා අයියණ්ඩි?''

''ඔව් මළයන්ඩි, කොලුවා මෙච්චර කාලයක් ඉඳලා තියෙන්නේ කොළොම්පුරේ බංගලාවක නෙවැ. මේ වංගියේ කොල්ලා එංගලන්තේ විශ්ව විද්‍යාලයකට යන්ටයි සූජානම.''

''කොලුවා විතරක් තනියම'' ඔහු පැවසීය.

''අනුර පුතා දැන් ලොකු ඉලන්දාරියෙක් නෙවැ. මළයන්ඩි. උඹම කියවල බලපන්කෝ මේ ලියුම් කඩදහිය.''

********

**බංගලාවට ආ කාරය**

''අනුර එංගලන්තයට ගොසින් තුන් අවුරුද්දක් ගත වී ගොසින්ය. ඔහු වසරකට පෙර ලංකාවට පැමිණීමට නියමිත වී ද යම් හේතුවකින් ඔහු ලංකාවට පැමිණීමට වසරක් පමණ ප්‍රමාද වීය.

රොබින් බංගලාවේ ආලින්දයේ කච්චියට වී වැතිර උන්නේය. රෑ මැදියම් යාමය වූයෙන් බංගලාවේ සියල්ලන් නින්දට ගොසින් සිටියහ. සිරිසෝම එකවරම අවදි වූයේ කාරයක නාදයක් ශ්‍රවණය වූ නිසාවෙනි. කිසිවෙක් බංගලාවේ දොරට තට්ටු කළේය. රොබින් ද තද නින්දක නොවූයෙන් හනික අවදි වූයේය. සිරිසෝම ද ආලින්දයට පැමිණියේය.

''කවුද පොඩි මහත්තයෝ මේ රෑ මැදියමේ ආපු එකා. මට මේ කාර් එකක සද්දයක් කනට වැකුණායින් මං ඇහැරුණා''

''බලමුකෝ සිරිසෝම'' ඔහු දොර විවර කරමින් කීය. ''අනුර !'' අනුර තුන් වසරකට පසු ලංකාවට පැමිණ ඇත්තේය. සන්තෝෂයට පත් රොබින් ඔහුව වැළඳ ගත්තේය.

''මං මේ වරායෙන් හවස හතරට ආ පාර සිරිසෝම කො දැන් ඩේවිඩ් අන්කල්?''

''මහත්තයා දැන් තුන් නින්දෙමුත් එහා ගොහින් ඇති. එන්ට පුංචි නිලමේ ඇතුලට. දැන් රෑ මැදියම නිලමේ, හෙට උදෑහනැක්කේ කතා බස් කළ හැකි නෙවැ.'' අනුර ගෙන ආ බඩු මුට්ටු තම සුරතට ගනිමින් සිරිසෝම කීය.

********

''සිරිසෝම කෝ දැන් අනුර සන්?'' අනුරගේ පැමිණි බව කන වැකුණු මොහොතේ ඩේවිඩ් මහතා විමසීය. ''ඩේවිඩ් අන්කල්! අනුර ඔහුට දණගසා වැන්දේය.

''ජේසු පිහිටයි! '' ඔහු අනුරට ආශිර්වාද කළේය.

''කාගෙද අර කාර් එක අනුර?''

ඒක මගේ ඩේවිඩ් අන්කල්, මෙන්න මේ තෑගි බෝග ටික අන්කල්ට, මේක සිරිසෝම මාමාට'' ඔහු තෑගි බෝග රාශියක් තිළින කළේය.

''මේ තෑගි බෝග මොකටද පුංචි නිලමේ, මට පේන්නේ පුංචි නිලමේ කොළඹ ටවුමේ වගේ එංගලන්තේ කරක් ගහල වගේ.'' සිරිසෝම කීය.

''හැබෑව ඔහු කීය. ''ඩේවිඩ් අන්කල් මං හෙට දිහාට දුම්බර දිහා දුම්බර දිහා යන්නට කියලා''

''අනුර එහෙ යන්නේ ආය නෑවිත් ඉන්ටමද '' රොබින් උද්‍යානයට පැමිණෙමින් ඇසීය.

''තාම හිතුවෙ නෑ රොබින් අපි බලමු'' අනුර හිස කසමින් කිය.

## ගම රට බලා

උදෑහනැක්කේ අවදි වූ අනුර බංගලාවේ ඇත්තන්ගෙන් සමුගෙන දුම්බර බලා පිටවීය. සත් වසරක් පමණ කල්ගත වීද එදා වලව්වෙන් පැන ආ දවස සේ අනුරට මං මාවත් පිළිබඳ තියුණු මතකයක් විය. ඔහු දුම්බර ඉස්ටේසම පසු කර ගියේ රේල්ලුවට එදා ඔහු නැගි ආකාරය සිහිගන්වමිනි. එදා තැපැල් කරත්තෙන් ගෑටූ ගමනට වඩා අද ඔහුගේම කාරයෙන් යන ගමන ඉතා වේගවත් විය. හෝරා දෙකකින් පමණ ඔහු ගමේ කඩමණ්ඩිය පසුකර ගියේය. එදා දුටු කඩමණ්ඩිය අදටත් එසේම තිබෙණු දැක ඔහු මවිත වූයේය. කඩමණ්ඩියේ හා මග දෙපස වූවන් බොරළු පාර දිගේ ඇදී යන කාරය දෙස හැරී බලන්නට වූහ. ගම්මානයේ ඇල, දොල, වැව්, ගහ, කොළ අනුර එනතුරු මගබලා සිටියා සේ සිනහ නගන්නට විය. වංගුවක් හැරුණු ඔහු තුන්මන් හන්දිය පසුකර ගියේ වලව්වේ මුල්ම දසුන දැකබලා ගනිමිණි. වලව්ව ඔහු දෙස බලා සිටින්නට වූයේ, ඉක්මණින් එන්නට යැයි කියාපාන්නක් මෙනි. ආලින්දයට වී සවස තේ සප්පායම් වෙමින් උන් ආරච්චිල නිලමේ හා ආරච්චිල මැණිකේ කාරයේ හඬ ඇසීමෙන් දොරකඩට ගොස් විස්මයෙන් බලා සිටින්නට වූහ. කාරය වලව්වේ වැටකඩුල්ල අසල නතර විය.

''අහල ගම්හතකවත් නැති කාර් එකක් කොහෙන්ද මේ වලව්වට කඩා පාත් වුණේ?'' ආරච්චිල මැණිකේ කියවන්නට වූයේය.

''බලාපන් කවුද කියලා!'' ආරච්චිල විලුබෙන් ඉස්සෙමින් කීය. ''මැණිකේ හැබෑට, බලන්ට අර ගජරාමෙට ආයිත්තම් වෙලා එන ටයි කෝට් කාරයා කවුද කියලා'' අනුර කාරයෙන් බසිනු දුටු ඔහු කීය. දෙන්න දෙමහල්ලන්ට අනුර සිතූ පරිදි ඔහුව හඳුනාගත නොහැකි විය.

''අම්මේ!'' වලව්වට ගොඩ වූ අනුර තම දෙමාපියන්ට දණ ගසා වැන්දේය.

''සන්තානම් මෑණියනේ මේ අපේ පුතණ්ඩියා නෙවැ උඹට තුණුරුවන්ගේම සරණයි'' මට උඹව අඳුරගන්නත් බැරි තරමට උඹ ඉලන්දාරියෙක් වෙලා නෙවැ.'' ආරච්චිල මැණිකේ සිය කඳුලැලි පිස දමමින් කීය. මළයණ්ඩි උඹ මෙහාට ආවනම්.''

අනුර තම පියාට ද දණ ගසා වැන්දේය. ''උඹට එහෙනම් ආයිත් වංගියක් වලව්ව මතක් වුණා නේද?'' අප්පෙක් තරවටු කාලම ගෙදරින් පැනල යන මේ වගේ පුත්තු මට උවමනා නෑ.'' ඔහු දැඩි ස්වරයෙන් කීය.

''එදා නිලමේ පුතාට තරවටු කළේ උගෙ ඇති වැරැද්දකට යෑ. පුතාගේ හිත නොතල ඉඳින්කෝ නිලමේ.''

''අයැම් සොරි අප්පච්චි''

'මොකක්ය කිව්වා? උඹ හිතුවද මට හොරි හැදිලය කියල. උඹ ඉංගිරිසියෙන් දොඩන හරුප මට තේරෙන්නේ නෑ බං. මයෙ හිතේ උඹත් දැන් කළු සුද්දෙක් ගානට වැටිලා. එසේ දෙඩූ ආරච්චිලා වලව්වෙන් පිටවූයේය.

''මා පුතා යමන්කෝ ඇතුලට''

''කෝ අම්මා මාමණ්ඩි?''

''ඇතුලෙ ඇති''

''අක්කණ්ඩි කාගෙද අර වාහනේ? කවුද ආවේ.'' ඔහු තම කුටියේ සිට විමසුවේය.

''වරෙන්කෝ මෙහෙට කවුද ආවේ බලන්ට!''

''කවුද අක්කණ්ඩි මේ?'' පිටතට ආ ඔහු ඇසීය.

''මාමණ්ඩි'' අනුර ඔහුට ද දණ ගසා වැන්දේ ය.

''අනුර පුතා !'' ඔහු ගැස්සී උඩ බිම බැලුවේය. ''මේ උඹ ද?''

''ඔව් මාමණ්ඩි''

''උඹට තුණුරුවන්ගේම සරණයි. උඹ දැන් ලොක්කෙක් වෙලා නෙවැ උඹගෙ ද අර කාර් එක?''

''මළයණ්ඩි පුතණ්ඩියාට මහන්සිත් ඇති නෙවැ කෑම ඩිංගිත්තකින් සප්පායම් වෙලා ආගිය තොරතුරු කතිකා කර ගත හැකි නෙවැ.'' මැණිකේ ඔහුගේ කතාවට බාධා කරමින් කීය. ''පුතාට උණු වතුර ඩිංගිත්තක් රත් කරන්ටද?''

''හොඳා, අපෙ අම්මා!''

**ආපසු හැරී බැලීමක්**

රාස්සිගෙ අව්ව වැටෙන යාමයේ අනුර තම කුටියට වී එංගලන්තයෙන් ගෙන ආ බඩු පොදිය ලිහා බැලුවේය. ඔහු ගෙන ආ නොයෙකුත් බඩු භාණ්ඩ රැගෙන වලව්වේ ආලින්දයට ගියේ ය.

"අම්මේ මාමණ්ඩිවත් එක්කන් මෙන්න මෙහාට ඩිංගිත්තක් ආවනම්"

"මොකෝ මේ"

"මෙන්න මේ තෑගි බෝග ටික අම්මාට, මේ ටික මාමණ්ඩිට!

"පුතාට මේවා ගන්න සල්ලි කොයින්ද ?"

"මං ඒ ගැන වග විස්තරේ පස්සේ කියන්නම්කෝ මාමේ !!

"මම නම් මේ තෑගි බෝගවලට වඩා උඹ අපිට ආපු එක තමා වටින්නේ මගේ රත්තරනේ" ආරච්චිල මැණිකේ අනුරගේ හිස අතගාමින් කීය.

"අම්මා, අප්පච්චිගේ තරහා ඇරුනු වෙලාවක මේ තෑගි බෝග ටික දෙන්ට ඕනා" ඔහු තම පියාණන් පෙනෙන මානයක වේ දැයි වටපිට බලමින් කීය.

"ඉතිං පුතණ්ඩියෝ පහුගිය ටිකේ උඹ කියපු කරපු දේවල් ගැන දැන්වත් කියපන්කෝ අනුරගේ මාමණ්ඩි නොයිවසිල්ලෙන් කීවේ ය.

"හොඳා !" අනුර දිගු සුසුමක් හෙළීය. "එදා මං රේල්ලුවෙන් කොළොම්පුරේ ගොහින් රෑ අම්බලමක නැවතුණා. එහෙදි තමයි මට ඩේවිඩ් අන්කල්ව මුලිච්චි වුණේ. එයා මාව එයාගේ බංගලෝ එකට එක්කන් ගියා. එහෙ හිටියේ එයාගේ පුතා රොබිනුයි වැඩට හිටිය මනුස්සයා සිරිසෝමයි. ඒ අය මට හරිම ආදරයෙන් සැලකුවා.

රොබින්ට උගන්නන්ට බංගලාවට ගවර්න්ස් කෙනෙක් ආවා. මමත් ඒ ටීචර්ගෙන් අවුරුදු හතරක් ඉගෙනගෙන විශ්ව විද්‍යාලයට යන්ට විභාගෙ ඵාස් වුණා. එංගලන්තෙට යන්ට දවස් දෙකකට පෙරින්දා මම ගමට ලියුම් කඩදහියක් එව්වා ඒක අම්මාට තැපැල්කාරයා ගෙනත් දුන්නද ?.

“ඔව් මයෙ පුතේ, ඉතිං කියාපන්කෝ කතාව” ඇය කතා බහට උනන්දුවෙමින් කීය.

“ඉතිං මං එංගලන්තෙට ගොහින් අවුරුදු දෙකක් ඉගෙන ගත්තා. එහෙදි මං පිස්කල් උපාධිය ගත්තා. තව අවුරුද්දක් මං එංගලන්තෙ පිස්කල්වරයෙක් විදියට වැඩකලා ඒකයි මං තව අවුරුද්දක් ප්‍රමාද වෙලා ලංකාවට ආවේ. පෙරේදා මං ලංකාවට ඇවිදින් කාර් එකක් මිලදී ගත්තා.”

“ඉතින් පුතා කොහොමද මේ දවස් දෙකට කාර් එලවන්ට පුරුදු වුනේ ?”

“මං එංගලන්තේ ඉන්දැද්දි කුලියට කාර් එකක් ගත්තා. එතකොට මට යන්ට පහසුයි නෙවැ අපෙ අම්මා” අනුර කීය. අනුරගේ කතාබහට සහභාගි නොවූයේ ආරච්චි නිලමේ පමණි නමුත් ඔහු තම නිදන කුටියට වී වැතිරී මේ සියල්ල අසා උන්නේය.

********

“මැණිකේ මොනවද මේ බඩු පොදියේ ?” ආරච්චිල මැණිකේ කුටියට රැගෙන ආ තෑගි බෝග දුටු ආරච්චිල විමසීය.

"පුතා එංගලන්තෙ ගොහින් මේ දේවල් ඇරගෙන ඇවිත් තියෙන්නේ නිලමේටමයි. පුතාගේ හිත නොතලා බලාපන්කො මොනවද දීල තියෙන්නෙ කියලා" එසේ කියූ ඇය මුළුතැන්ගෙය වෙත ගියාය.

********

පසුදා උදෑසනින්ම කවිච්චියේ වාඩි වී අනුර ඈතින් පෙනෙන තුන්මන් හන්දිය දෙස බලා උන්නේය. ආරච්චි නිලමේද එතැනට පැමිණියේය. අනුරට ප්‍රීතිය දනවන යමක් ඔහු දුටුවේය. ඒ ඔහු එංගලන්තයේ සිට තම පියාණන් උදෙසා ගෙන ආ අත් ඔරලෝසුව ඔහු පැලද සිටිනවා දුටු හෙයිනි. ඔහු කිසිවක් නොදුටුවා සේ තම පියාණන්ට ඇමතුවේය.

"අප්පච්චි බැහැරක් යන්ට ද ?"

"මං මේ දුම්බරට ගොහින් එන්ට" ඔහු තරමක් කාරුණික අන්දමින් කීය.

"අප්පච්චි කරත්තෙන් ගාටන්ට උවමනා නෑ මං කාර් එකෙන් අප්පච්චි එක්කන් යන්නම්"

"මා පුතා මාව කඩමණ්ඩියට ඇරලුවා නම් ඇති පියදාස මාමණ්ඩිත් එක්කලා රාජකාරි කටයුත්තකට යන්නේ. උන්දෑ මාත් එක්කල අමනාප වෙයි" ඔහු කීය. "උඹ කොහෙද මේ යන්ට තනන්නේ ?"

"මං මේ සිරිමල්ව මුලිච්චි වෙන්ටය කියලා"

ඔහු කී බස අසා සිටි ආරච්චිලගේ මුව කළු වලාවකින් වැසිණ.

"මා පුතා උඹට මට වැදගත් කාරණාවක් කියන්න තියෙනවා. අපි ගමන පිටත් වෙමුකෝ"

ආරච්චිලත්, අනුරත් කාරය වෙත ගියහ. ආරච්චිල තම පුත්‍රයාගේ කාරයට නැගුණේ මහත් ආඩම්බරයෙනි. අනුර කාරය පණ ගැන්වීය.

"අප්පච්චි මොකක්ද කියන්ට තියෙනවායි කීව කාරණය ?" අනුර උනන්දුවෙන් ඇසීය.

"මා පුතා මේ කාරණාව අහලා කලබල වෙන්ට උවමනා නෑ." සිරිමල් කොලුවා ගමේ නෑ"

"ඇයි අප්පච්චි සිරිමල් කොහෙ ගිහින්ද ?"

"මීට දෙතුන් මාසෙකට ඉහත සිරිමල් උගෙ උප්පා සියදේරිස් එක්ක රෑ මැදියමේ හොරකමේ ගොහින් තියෙනවා,

ගොහින් තියෙන්නේ එහා ගමේ බණ්ඩාර මාමණ්ඩිගෙ වලව්වට. මහඑකා දොරකඩ නැවතිලා පුතණ්ඩියාව වලව්වට යවලා ඌ ගිහින් උන්ගේ මුළු සේසතම සුද්දකරන් එනකොට වලව්වෙ අප්පුගෙ මූණට ම උෟව මුලිච්චි වෙලා සිරිමල් කොලුවා බඩු පොදිය අතෑරලා එලියට දුවගෙන එනවා දැක්ක සියදේරිස් අප්පුට ගිනි බටේ පත්තුකරලා බැද්දට රිංගාපි. අප්පුගෙ මරළතෝනියට දුවගෙන ආපු බණ්ඩාර මාමණ්ඩි වැර වෑයමෙන් සිද්ද වෙච්ච හදිය අප්පුගෙන් දැනගෙන. පොලීසියේ රාළහාමිලා ඇවිදින් උන්ව අල්ලගෙන, අප්පු මළා හින්දා මීට දෙතුන් දොහකට පෙරින් සියදේරිස්ව එල්ලුම් ගස් යැව්වා. අපිට සිද්ධ වෙච්චි නවනිංගිරාව කවදා අකාමකා ගන්ට පුළුවන් වෙයිද මන්දා මයෙ පුතේ."

"එතකොට සිරිමල්"

"පොඩි හාමුදුරුවෝ නම් දෙතුන් වංගියක් බෝගම්බර වැඩලා තිබ්බා උන්වහන්සේගෙන් තමයි උඹට ඒ ගැන දැනගන්ට වෙන්නෙ."

"සිරිමල් කරපු වැරැද්දක් නෑ අප්පච්චි"

"උඹ කොහොමද රටේවත් ඉන්නෙ නැතුව ඒ වගක් කියන්නේ ?" ආරච්චිල කාරයේ ජනේලයෙන් පිටතට බුලත් කෙළ ගසමින් කීය.

"අප්පච්චි නොදන්න දේවල් ගොඩක් මන් දන්නවා" අනුර කඩමණ්ඩියේ කාරය නතර කරමින් කීය. ආරච්චිල නිලමේ ඉදිරියේ නවතා තිබූ කරත්තය වෙත ගියේය. කඩමණ්ඩියේ සිටියවුන් කුඩා කාරය වෙත කුහුලින් නෙත් හෙලුවෝය.

ඔවුහු බලාඋන්නේ කාරය තුළ සිටිනා අමුත්තා දැන් බසීවි දැන් බසීවි යන අදහසිනි. ගම්මුන්ගේ සිතැගියාව ඉටුකරමින් ඔහු කාරයෙන් බැස සිටියේ පන්සලට යාමට අවශ්‍ය අඩුම කුඩුම මිලදී ගැනීමටය. දාම් අතක් අදිමින් සිටි එක් ගැමියෙකු අනුරට ඇමතීය.

"ඔය මහත්තයා මේ ගම් තුලානෙ නම් වෙන්ට බෑ."

"නෑ අයුබෝවණ්ඩ, මං මේ ආරච්චිල වලව්වේ"

"ඔය මහත්තයා කාගේ කවුද ?" කඩේ මුදලාලි විමසීය.

"මගෙ අප්පච්චි ආරච්චිලා ආයුබෝවණ්ඩ"

"මොකක් කිව්වා මේ පුංචි නිලමේද ?"

"හැබෑව"

"මටත් කනින් කොනින් ඔය වගක් ආරංචි වුණා. හැබෑට පුංචි නිලමේ මෙච්චර දොහක් කොහෙද අන්තරස්දාන වෙලා හිටියේ ?"

“මං අවුරුදු හතරක් කොළාම්පුරේ බංගලාවක උන්නේ. තුන් අවුරුද්දක් එංගලන්තෙ විශ්වවිද්‍යාලයක උගෙන ගත්තා” අනුර කීය. “මුදලාලි මට සුනන්ගු වෙනවා. මට සුවඳ කූරු ටිකකුයි, පහන්තිර ටිකකුයි දුන්නා නම් මෙන්න සල්ලි.

“ආ පුංචි නිලමේ”

********

කාරය තුන් මන් හන්දියෙන් වමට හැරෙන්නට විය සත් වසරකට පසු අනුර විහාරයට යන මුල්ම අවස්ථාව මෙයයි. කුඩා මිටියාවත තුළ වූ ඈතින් පෙනෙන වලාකුළු බැම්ම දෙස නෙත් හෙලු අනුර කාරයෙන් ඉගිලි ගියේ විහාරය අතුරුදන් වේදෝයි සිතන්නකු ලෙසිනි. මලින් බරව තිබූ පිච්ච වැලක් දුටු ඔහු මඳකට ගමන නවතා කැන්ද කොළයකින් ගොටුවක් සාදා තමාට සිත්සේ මල් නෙලා ගත්තේය. නැවත කාරය පණ ගැන්වූ හෙතෙම විහාරය වෙත නික්මුණේය. කාරය විහාරයේ වැලි මළුවේ ගිමන් හරින්නට විය.

“උක්කුං බලාපන් කවුද ආවේ කියලා” කාරයේ නාදය කනට වැකුණු ලොකු හාමුදුරුවන් ආවාස ගෙයින් පිටතට වඩිමින් කීහ.

“ලොකු හාමුදුරුවනේ, මයෙ හිතේ ඔය ආවේ පුංචි නිලමේ වෙන්ටැති. මේ ගම් තුලානෙ කාටවත් කාර් එකක් නෑ නෙවැ.” ඔහු කීය. “මට ආරංචි පුංචි නිලමේ එංගලන්තෙ ඉදලාලු ආවේ එනකොට ආවේ. අපේ හාමුදුරුවනේ කාර් එකකින්ලු ගමේ එකාලා කිව්වේ පුංචි නිලමේගේ අතමිට හේමත් සරුවෙලාලු”.

“මටත් ආරංචි බොල ඔය විත්තියක්” ලොකු හාමුදුරුවෝ කීහ.

********

"තුණුරුවන්ගේ සරණයි !" මල් පහන් පූජා කර ආවාස ගෙය වෙත පැමිණි අනුර ලොකු හාමුදුරුවන්ට නමස්කාර කළේය. ලොකු හාමුදුරුවෝ ඔහුට ආශිර්වාද කළහ.

"ඉතිං පුංචි නිලමේ ! කොහොමද වංහුං"

"වරදක් නෑ අපෙ හාමුදුරුවනේ ! කාලෙකට පස්සේ පන්සලකට ගොඩවැදිලා මල් පහන් පූජා කළේ ".

"කොළොම්පුරේදිවත් ඔය නිලමේ පන්සලකට ගියේ නැද්ද ?"

"කොළොම්පුරේ බංගලාවේ ඉන්දැද්දිනම් ඒ අහල පහල පන්සලක් තිබුණා අපෙ හාමුදුරුවනේ"

"හැබෑද ?" නිලමෙගෙ අතමිට නම් සරුවෙලා නෙවැ."

"එහෙමයි අපෙ හාමුදුරුවනේ" අනුර කීය.

"මං මේ තකහනියක් ආවේ, සිරිමල්ගේ ඇබැද්දිය මගේ කණට වැකුණායි අපෙ හාමුදුරුවනේ. අප්පච්චි කිව්වා පොඩි හාමුදුරුවන්ගෙන් සිරිමල් ගැන ආරංචියක් දැනගන්ට හැකිවෙයි කියලා."

"පුංචි නිලමෙ යමුකෝ ආවාස ගෙට ගොහින් නිවී හැනහිල්ලේ පොඩි හාමුදුරුවෝ එක්ක කතිකා කළ හැකි නෙවැ."

"එහෙමයි අපෙ හාමුදුරුවනේ !"

**සිරිමල්ගේ චින්නැහිය**

"පුංචි නිලමේ මේ වංගියේ ආපිට කොළොම්පුරේ යන්ටද කල්පනාව ?"

"නෑ පොඩි හාමුදුරුවනේ"

"මොකක්ද ඔය නිලමෙ ආ කාරණාව ?"

"පොඩි හාමුදුරුවනේ සිරිමල්ට වුණ චින්නැහිය මට අප්පච්චි කිව්වේ මේ උදෑහනැක්කේ නොවැ ඔබ වහන්සේ බෝගම්බර වැඩියා කියලා මට ආරංචි වුණා. මයෙ හිතේ සිරිමල්ට නීති මාර්ගයෙන් මට උපකාරයක් කළ හැකියි කියලා."

"මට ඒ වගක් කල්පනා වුණේ නෑ නෙවැ. පුංචි නිලමෙට හැකිවෙයි මගෙන් මොකක්ද කෙරෙන්න උවමනා උපකාරය?"

"බෝගම්බර ගියොත් මට රාළහාමිලා සිරිමල්ව මුලිච්චි වෙලා කතිකා කරන්න ඉඩදෙයිද හාමුදුරුවනේ"

"පුංචි නිලමේට නම් බොහෝවිට සිරිමල්ව මුලිච්චි වෙන්ට ඉඩදෙයි මයෙ හිතේ. පුංචි නිලමේ කරන දෙයක් ඉක්මනින් කළොත් හොඳා. මොකද ගිය වංගියේ උසාවියේ නඩු තීන්දුව දවසේ අපේ පාර්ශවේට පිස්කල්වරයෙක් හිටියෙ නෑ. ඊළඟ නඩු විභාගය දවසට තව සුමානයක්වත් නෑ නෙව. පිස්කල්වරයෙක්ට මුදල් ගෙවන්න තරම් අපේ ගමේ එකාලට වත්කමක් නෑනේ පුංචි නිලමේ."

"එහෙමයි පොඩි හාමුදුරුවනේ ඒ බව හැබෑව මං හෙට අනිද්දා සෙංකඩගල ගොහින් එන්නම්කෝ. එහෙනම් මං පොඩි හාමුදුරුවනේ ගොහින් එන්නම්"

"හොඳා, පුංචි නිලමේට තුණුවරුවන්ගේම සරණයි." අනුර පොඩි හාමුදුරුවන්ට නමස්කාර කළවිට උන්වහන්සේ අනුරට ආශිර්වාද කළහ.

********

අනුර කිසිවෙකුට නොපැවසුවද සිරිමල්ට අත්වූ ඉරණම නිසාවෙන් ඔහු හිත යටින් දුක්විය. ඔවුහු ඥාති සොහොයුරන් පමණක් ම නොවූහ. කුඩා කල සිට ම අඹ යහළුවන්ද වූහ.

සිරිමල්ට කිසිවෙක් තරවටු කළ විට අනුරට එය නුරුස්සන්නේය. සිරිමල්ට ද එසේමය. පාසල් වියේ ඔවුන් අඬදබර වූ අයුරු සිහි වී අනුරගේ දෙනෙත් කඳුලින් පෙඟින. අවසන්වරට ඔහු දුටු මොහොතේ බාප්පොච්චාව දැක ඔහු බිය වූ අයුරු, අනුරට මැවී පෙනෙන්නට විය.

"මයෙ රත්තරනේ මොකෑ මේ තනියම අඬන්නේ ?" අනුරගේ නිදන කුටියට පැමිණි ආරච්චිල මැණිකේ විමසන්නට විය. අනුර තම මෑණියන්ගේ උකුලේ හිස තබා තම කඳුළු පිස දමන්නට විය.

"අම්මේ මට පුළුවන් වෙයිද සිරිමල්ව හිරෙන් නිදහස් කරගන්න ?"

"මා පුතාට පුළුවන් වග උඹ දන්නවා නෙවැ. මේ ගමටම ලොකුම උගතා උඹයි මයෙ පුතේ. සිරිමල් ගැන පුතා අපිටත් වඩා ගොඩක් දේවල් උඹ දන්නවා නෙවැ. තුණුරුවන්ගෙ සරණින් මා පුතේ උඹට හැකියි."

"අම්මා, පුංචි අම්මාව මුලිච්චි වෙලා එන්ට ගියාද ?"

"මම සුමාන ගණනකින් ගියේ නෑ පුතේ ? මොකද නගණ්ඩිට තියෙන හිතේ අමාරුවේ හැටියට මොළේ කොළොප්පන් නොවී තියේයි යෑ."

"අම්මා මේ කියන්නට තනන්නේ පුංචි අම්මාට තවත් වින්නැහියක් කියලාද?".

"පුංචි අම්මාට මොළේ කොලොප්පම්වෙලා තියෙන්නේ සියදේරිස්ව එල්ලුම් ගස් යවපු එකට මිසක් සිරිමල් කොලුවා ගැන තියෙන හිතේ අමාරුවකට නොවෙයි මයෙ පුතේ. උන්දැගේ කල්පනාව තිබ්බේ අලුගෝසුවොන්ට කොඩිවිනයක් කරලා හරි මිනිහ බේරගන්ට" ආරච්චිල මැණිකේගේ මළයන්ඩි කතාබහට හවුල් වෙමින් පැවසීය.

"මාමණ්ඩි මං හෙට බෝගම්බර ගොහින් එන්ටය කියලා"

"පුතණ්ඩියාට තනියම ගොහින් එන්ට හැකිද ?" ඔහු ඇසීය.

"මළයන්ඩි මයෙ පුතා දැන් ලොකු ඉලන්දාරියෙක් නෙවැ" ආරච්චිල මැණිකේ අමනාපයෙන් කීවාය.

"මට ගොහින් එන්ට හැකියි මාමේ !" අනුර කීය.

********

අනුර උදෑහනැක්කේම වලව්වෙන් පිටමං වූයේ සෙංකඩගල බලාය. හෝරා තුන හතරකින් අනුර සෙංකඩගලට ළඟා වූයේය. ඔහු කුඩා කල්හි දළදාව වන්දනාමානයට ගියායින් පසු මෙවර දළදාව වන්දනා නොකර යාමට ඔහුට සිත් නොවීය. ඔහු තම කාරයට ගිමන් හැරීමට සලස්වා දළදා මැඳුර වෙත පියමැන්නේය. කිරි මුහුදේ සිට නැගෙන සිහිල් සුළඟට ඔහුගේ විඩාව අතුරුදන්ව යාමට විය. දළඳා සමිඳුන් වන්දනාමාන කළ මොහොතේ අනුරට තම මෑණියන් දුන් අවවාදය සිහිපත් විය.

"මයෙ පුතේ උඹට විතරයි සිරිමල් පුතාව බේරගන්ඩ පුළුවන්. ගමේ එකාලගේ කටවල් වහලා අපිට මේ නවනින්ගිරාවෙන් නිදහස් කරන්ටත් පුළුවන් උඹට විතරයි. අනේ පුතේ උඹට පුළුවන් දෙයක් කරපන්." තම මෑණියන්ගේ ආශිර්වාද ස්වරයෙන් අනුර තව තවත් ප්‍රබෝධයට පත්වූයේය. දළඳා මැදුරෙන් නික්ම ගිය ඔහු කිරි මුහුදේ වැව් ඉවුර දිගේ ඇවිද ගියේ වළාකුළු බැම්මේ අසිරියත්, කිරි මුහුදේ නැගෙන දිය රැළිවලත් ඇති සුන්දරත්වය හිටිවන කවියක් කර දෙතොලින් මුමුණාමිනි.

මඳ දුරක් ඇවිද ගිය ඔහු තම නවතා තිබූ කාරය වෙත ගොස් එය පණගැන්වීය.

මඳ දුරක් යනවිට වීදියේ සිටි ඇතමෙක් කාරය දෙසට අත දිගුකරන්ට විය. ඔහු වැදගත් කෙනෙකු ලෙස පෙනුන හෙයින් අනුර කාරය ඔහු ඉදිරියේ නැවතුවේය. ඔහු අනුර අසල වූ කාරයේ ඉදිරිපස අසුනේ හිඳගත්තේය.

"අද හරි ගිනි කාෂ්ටකේ නේද මහත්තයෝ." ඔහු ගරුසරු ඇතිව කතා කළේය.

"ඒ බව නම් හැබෑව ආයුබෝවන්ඩ" අනුර කීය.

"ඔහේ මේ කොහෙ යන ගමන්ද ?"

"මං මේ බන්ධනාගාරේ අළුගෝසුවෙක් ! ඉතිං මහත්තයෝ මං බෝගම්බර යන ගමන් !"

"ඔය උන්නැහේම මුලිච්චි වුණ එක හොඳා මමත් මේ බෝගම්බර බන්ධනාගාරයට යන ගමන්"

"ඔයම හත්තයා එහෙ යන්නේ මක්කටැයි ?"

"තමුන්නැහේට මතකද මීට දෙතුන් දොහකට විතර ඉහත එල්ලුම් ගස් යවපු සියදේරිස් කියලා මිනිහෙක්ව ?"

"ඔය මිනිහව අමතක වෙන්නේ කොහොමද මහත්තයෝ, අර මිනී මරපු මිනිහනේ ඔය !"

"හැබෑව, මං යන්නේ උන්දැගේ පුතා සිරිමල්ව මුලිච්චි වෙන්ට !"

"උගව මුලිච්චි වෙන්ට කාටවත් ඉඩදෙන්නේ නෑ මහත්තයෝ !" ඔහු කීය. "හැබැයි ගමේ ආරච්චිල මහත්තයා වගේ උත්තමයෙක්ට නම් ඉඩදෙයි මයෙ හිතේ."

"එහෙමයි මට යා හැකිවෙයි. මගේ අප්පොච්චි තමයි ගමේ ආරච්චිල, ඊටත් මං යන්නේ සිරිමල්ගේ පාර්ශවේ පිස්කල් හැටියට"

"එහෙනම් ඔය මහත්තයාට යා හැකි" අළුගෝසුවා කීය. "මහත්තයෝ අතනින් වමට හරවලා, එතන වාහනේ නවත්තමු."

********

"මං නම් තව සුමානයයි මේ හිර කූඩුවේ ලගින්නේ. ඊත් සිරිමල් මට දුක උඹට මොන කලයක් යයිද කියන වගට." අමර කීවේය. "මං නම් හිතන්නේ නෑ උඹ අර කියපු ආරච්චිගේ කොලුවා උඹව බේරගන්ට ඒවි කියලා. උගට ඔච්චර කැක්කුමක් තියෙනවා නම්, උඹ මෙලහකටත් ගෙදර ගොහින්."

"තොගෙ ඔය කට කියවිල්ල නවත්තපන්. අන්න අර යෝධයා මෙහෙට කඩාපාත් වෙන්ටයි යන්නේ ?" සිරකුටිය වෙත එන හිරපල්ලා දෙස බලමින් සිරිමල් දත් විලිස්සීය.

"නොම්මර අසූ එක, අන්න උඹව මුලිච්චි වෙන්ට මහත්තයෙක් ඇවිල්ලා එනවා එළියට !" හිරපල්ලා සිර කුටියේ ඉබ්බා අරිමින් සිරිමල්ට කීවේය. සිරිමල් තම මිතුරා දෙස ඇසිපිය හෙලා හිරපල්ලා සමඟ පිටව ගියේය.

********

"එන්න මහත්තයෝ මෙහෙන් ඇඳි ගන්ට. මං හිරපල්ලෙක්ව යැව්වා. සිරිමල්ව එක්කන් එන්ට !" පොලිස් රාළහාමි අනුරව පිළිගනිමින් කීවේය. "මහත්තයෝ මට ඔය මහත්තයාට කියන්ට වැදගත් කාරණාවක් කියන්ට තියෙනවා."

"මොකක්ද රාළහාමි ?"

"මෙතෙන්ට හිරකාරයාව එක්කන් ආවහම අපිට විතරක් පෞද්ගලිකව කතා කරන්ට උවමනා වුණොත්, ඔය මහත්තයාට හැකියි නෙවැ ඉංගිරිසියෙන් දොඩන්ට ?"

"මට හැකියි රාළහාමි !" අනුර කීවේ "රාළහාමිටත් මට කියන්ට කාරණාවක් තියෙනවා."

"ඒ මක්කද මහත්තයෝ ?"

"රාළහාමි මං සිරිමල්ගේ ඥාතියා අනුර වග සිරිමල්ට නොකියා ඉන්ට මං එයාගේ පාර්ශවේ පිස්කල් වග විතරක් කීවට කාරි නෑ."

"හොඳා, ඒ අදහස නම් හොඳා !" පොලිස් රාළහාමි ඊට එකඟ වූයේය. "අන්න මහත්තයෝ මුලිච්චි වෙන්ට ආ මිනිහා එනවා." ඔහු වෙනතකට නෙත් හෙලමින් කීවේය. අනුරගේ හිස එක්වරම පිටුපසට හැරෙන්නට විය. හිරපල්ලා සමඟ පැමිණි ජම්පරය ඇඳ සිටින මිනිසා දෙස අනුර නෙත් හෙලුවේය. එම මිනිසා උස මහතැති රැවුල වවාගත් අපිරිසිදු

පෙනුම ඇති අයෙකු වූයේය. අනුරට ඔහු සිරිමල් යැයි විශ්වා සළ නොහැකි වූයේය. ඇතැම්විට ඒ සත් වසරකට පමණ පසු ඔහු දුටු හෙයින් විය හැක. පොලිස් රාළහාමි සිරිමල්ට අසුන්ගන්නා ලෙස අතින් සංඥා කළේය.

"මේ තමයි මහත්තයෝ සිරිමල් !" එසේ කියූ රාළහාමි තව තවත් දේ අනුර සමඟ ඉංගිරිසියෙන් දොඩන්නට වූයේය. ඉන්පසු ඔහු සිරිමල් වෙත හැරුණේය. සිරිමල්ද උවමනාවෙන් ඔවුන්ගේ ඉංගිරිසි කතාබහ දෙස බලා සිටියේය.

"සිරිමල් මේ තමා උඹේ පාර්ශවේ පිස්කල් අනුර මහත්තයා" රාළහාමි තම කට වරද්දා ගත්තේය. එබැවින් අනුර ඔහු දෙස තියුණු බැල්මක් හෙලුවේය. රාළහාමි හිස නමා අනුර දෙස බැලුවේ සමා අයදින්නාක් මෙනි. අනුර යන නාමය ඇසීමෙන් සිරිමල් ප්‍රාණවත් වී උන්මන්තකයකු සේ හැසිරෙන්නට වූයේය.

"අනුර, මේ උඹද ?"

"කටවහගනින් මේ වගේ උත්තමේකුට උඹ කතාකරන්නේ මෙහෙමද ?" රාළහාමි සැර පරුෂ වූයේය.

අනුරට තම මිතුරාගේ බලාපොරොත්තු කඩ කිරීමට නොසිතුනේය.

"ඔව් සිරිමල්, මං උඹේ යාළුවා වගේම ඥාතියා"

"උඹ මෙච්චර දොහක් කොහෙද හිටියේ ? ඇත්තද උඹ පිස්කල් කෙනෙක්ය කියන කාරණාව ?"

අනුර මෙපමණ කලක් කල් ගෙවූ ආකාරය සිරිමල්ට කියා සිටියේය.

"අනුර උඹ නම් සුදු මහත්තයෙක් වගේමයි. මට මේ උඹමද කියලා හිතාගන්නවත් බෑ"

"හරි අපිට මේ දේවල් ගැන පස්සේ කතා කළ හැකි නෙවැ. අපි දැන් කාරණාවට බහිමු. අනුර පිළිවදන් සැපයූයේය. "උඹ කියපන් මට, මං නැති ටිකේ ඉඳලා මේ වෙනකම් වෙච්චි හැමදේ ගැනම"

"හොඳා" එසේ කියූ සිරිමල් තව තවත් පුටුවට හේත්තු වී හරිබරි ගැහුණේය.

"අනුර උඹ ගමෙන් ගොහින් දෙතුන් මාසෙකට විතර පස්සේ මගේ ඉස්කෝලේ ගමන නතර වුණා. අම්මා කියපු නිසා මං අප්පච්චිට හොරෙන් පුළුවන් වෙලාවට පන්සලට ගොහින් ලොකු හාමුදුරුවන්ගෙන් උගත්තා. ඒ පිළියමත් අප්පච්චිට මාට්ටු වුණායින් නතර වුණා."

"ඉතිං සිරිමල් එදායින් පස්සේ මක්කද වුණේ ?"

"අප්පච්චි එහා ගමේ බණ්ඩාර මාමණ්ඩිලාගේ පොල්වත්තේ වැඩට ගියා. මම ඒ කාරණාවට ඒ තරම් මනාප නොවුණත් අප්පච්චිගේ තරවටු කිරිල්ල නිසා මට නොගිහින් බැරිවුණා."

"අප්පච්චි උඹ ලවා හොරකම් කෙරෙව්වෙ එහෙම නැතුවාද ?" අනුර සිරිමල් වෙත වැදගත් ප්‍රශ්නයක් එල්ල කළේය. සිරිමල් අනුර දෙස හිස් බැල්මක් හෙලුවේය. "සිරිමල් උඹ ඇත්ත කිව්වොතින් විතරයි උඹට හිරෙන් නිදහස් වෙන්ට පුළුවන්. නැත්තම් උඹටත් හැකියි හිරිබත් කකා මෙහෙම ලගින්ට"

“අප්පච්චි මං ලව්වා එහා ගමේ එකාලගේ ගෙවල් බින්දව්වා අනුර උඹ දන්නවා නෙවැ මං මේවා කරන්නේ මගෙ මනාපෙට නෙමෙයිය කියලා”

ඒ වග මං පිංචි සන්දියේ ඉඳලම දන්න කාරණාවක් නෙවැ උඹ කියන්නේ අප්පුගෙ මළගමට පෙරින්, වෙතින් වින්නැහි නොවෙච්චි වගද ?”

“උඹ මාව විශ්වාස කරනවා නම් උඹේ තීන්දුව හරි”

“සිරිමල් උඹ කියාපන් බණ්ඩාර මාමණ්ඩිගේ වලව්වෙදි වෙච්චි වින්නැහිය ගැන. එවා වෙච්චි හැමදේම අඩුවක් නෑර උඹ මට කියන්ට උවමනයි මක්කද කිව්වොතින් උඹේ නඩු තීන්දුවදාට ඒ පුංචි කාරණාව පවා වැදගත් වෙන්ට ඉඩ තියෙනවා”

“උඹ ඒ ගැන විස්සෝප වෙන්ට කාරි නෑ. එදා වෙච්චි වින්නැහියේ අකුරක් නෑර මං උඹට කියන්නම්” එසේ කියූ සිරිමල් බණ්ඩාර වලව්වේදි සිදු වූ කාරණා කාරණා අනුරට වටහා දුන්නේය. පෙරින්දාක ආරච්චිල නිළමේ අනුරට පැවසූ අයුරින් සිරිමල්ද බණ්ඩාර වලව්වේ සිදු වූ ඇබැද්දිය අනුරට විස්තර කළේය.

“පොලිස් රාළහාමි තමුන්නැහේ ගාව ඔරලෝසුවක් එහෙම නැතුවාද ?” අනුර පොලිස් රාළහාමිගෙන් විමසුවේය.

“මහත්තයෝ දැන් වෙලාව හරියට ම කිව්වොතින් හැන්දෑවේ හයට කිට්ටුයි!”

“හැබෑද, සිරිමල් මං උඹෙන් මට උවමනා කරන කාරණා ටික දැනගත්තා එහෙනම් අනිද්දා ඒ කියන්නේ නඩු විභාගේ දවසේ අපිට මුලිච්චි වෙන්ට හැකි නෙවැ”

එසේ කියූ අනුර රාළහාමි සමග ඉංගිරිසියෙන් කාරණා කාරණා කතා බස් කරගත්තේය. අනතුරුව අසුනින් නැගිට ඔහු සිරිමල් දෙස බලා නැවතත් ඔහු ඇමතුවේය.

"සිරිමල් මං එහෙනම් ගොහින් එන්නම්. අලුයම් දූරෙට පෙරින් දුම්බර යත හැකිවෙයි මයෙ හිතේ."

"ඉතිං උඹට හැකිනෙවැ රාත්තිරිය සෙංකඩගලම ගතකරලා හෙට උදෑහනැක්කෙම වලව්වට යන්ට"

"නෑ, සිරිමල් නඩු තීන්දුව දාට උවමනා වෙන කාරණා ඩිංගිත්තක් තියෙනවා තව හොයාගන්ට.

ඒවා ගමේ එකාලගෙන් දැනගන්ට උවමනා කාරණා උඹ විස්සෝප වෙන්ට උවමනා නෑ. මක්කද උඹේ වැරැද්දක් නැතුවා නම් ඔය හැටි ඒ ගැන වඳ වෙන්ට උවමනා නෑ.

"උඹෙන් මට තව කාරණාවක් දැනගන්ට උවමනායි." සිරිමල් අනුර දෙසට හැරෙමින් කීවේය.

"ඒ මොන කාරණාවක්ද ?"

"මයේ අම්මා ලෙඩක් දුකක් නැතිව යහතින් ඉන්නවා නේද ?"

"උඹ බය නොවී හිටපන් පුංචි අම්මා අතුරු ආන්තරාවක් නැතිව ඉන්නවා" සිරිමල්ට පිළිතුරු දුන්නේය.

********

"මොකෝ සිරිමල් උඹ මේ අහස පොළොව ගැටගහන්ට තරම් කල්පනා කරන්නේ උඹ අර ආපු එකාව මුලිච්චි වෙලා ගොහින් ආව ආවමයි මයෙ එක්ක වචනයක්වත් දෙඩුවෙ නෑ. මොකො මයෙ එක්කලා අමනාප වෙලාවත්ද ?" දිරච්ච බංකුවක් මතට වී හාන්සි වී බලා සිටින සිරිමල් දෙස බලමින් අමර විමසුවේය.

"මං මොකෝ උඹ එක්කලා අමනාප වෙන්නේ ඇයි අපිට බූදලේ බෙදාගන්ට බැරුවද ?"

"එහෙනම් උඹ මොකක් ගැනද ඔය හැටි විස්සෝප වෙන්නේ ?"

"මං මේ කල්පනා කෙරුවේ අනුර ගැන." සිරිමල් කීවේය. "අනුර නම් සුදු මහත්තයෙක් වගේමයි මගෙ පෙරින් පිනකට වාගේ ඌ පිට දේසෙක ඉඳන් හරි කලට වෙලාවට ඇවිත් නෙවැ."

"ඉතිං ඒ මහත්තයා උඹ එක්කලා මක්කද දෙඩුවේ ?"

"අනුර කිව්වේ, මගේ අතේ වරදක් නැතුවානම් ඒ ගැන විස්සෝප වෙන්ට උවමනා නෑය කියලයි."

"ඉතිං ඒ උත්තමයා කිව්ව කාරණාව හරි නෙවැ" අමර කීවේය. "ඇයි උඹේ අදහස මෙහෙන් තොලොන්චි නොවී, හිරබත් කකා මෙහෙම ළඟින්ටද ?

"මං මේ ඉස්පාසුවක් නැතුව උන්නේ අනිද්දාට යෙදෙන නඩු තීන්දුවදාට මක් වෙයිද කියල හිතලයි."

"උඹ හිස කඩිත්තුවක් හදාගන්නැතුව ඉදහන් ! අනිද්දාට වෙන දෙයක් වෙච්චදෙන්" අමර නැවතත් සිරිමල්ට කියෙව්වේය.

********

“මා පුතා උඹ අලුයම් දුරේද වලව්වට ගොඩවැදුණේ ?” එළිවන යාමයේ වලව්වේ ආලින්දයට පැමිණි ආරච්චිල මැණිකේ විමසුවේ කව්ච්චියට වී තද නින්දේ පසුව සිටි අනුරට බාධාවක් එල්ල කරමිණි. තම මෑණියන්ගේ හඬින් අවදිවුණු අනුර කව්ච්චියේ ඇන්දට හේත්තු වී හිරිහැර ගත්තේය.

“ඔව් අම්මේ, මං වලව්වට ගොඩ වැදෙනකොට අම්මලා තුන් නින්දෙනුත් එහා ගොහින් ඉන්ටැති. ඒ හන්දා මං ආ හැටියේම කව්ච්චියේ හාන්සි වුණා.”

“ඉතිං පිස්කල් උන්නැහේ කොහොමද වාසේ දෙසේ උදැහනැක්කේ ආලින්දයට සපැමිණි ආරච්චිල මැණිකෙගේ මළයණ්ඩි අනුරට කොලොප්පමින් කීය “ගිය කාරණාවේ නම් වරදක් නෑ මාමණ්ඩි!”

අනුර කීවේය. “මාමණ්ඩි, මාමණ්ඩිට හැකිද අද පන්සලට ගොහින් පොඩි හාමුදුරුවන්ට කාරණාවක් දන්වන්ට ?

“මොකක්ද පුතා කාරණාව ?”

“හෙට උදැහැනැක්කේම සෙංකඩගල යන කාරණාව ගැන. මාමණ්ඩි මයෙ අදහස හෙට නඩු විභාගෙ දාට අප්පච්චිවයි, මාමණ්ඩිවයිත් කැන්දන් යන්ට හෙට ගමන ගැන පොඩි හාමුදුරුවන්වත් දැනුවත් කළොත් හොදයි නෙව. මං දැන් බණ්ඩාර වලව්වට යන්ට උවමනයි.”

“ඒ මක්කටැයි පුතේ ?” ආරච්චිල මැණිකේ විමසීය.

“හෙට නඩු තීන්දුවට බණ්ඩාර මාමණ්ඩිගෙන් කාරණාවක් දැනගන්ට උවමනයි !”

********

උදෑසන පාතරාසය ගත් අනුර තම කාරයෙන් බණ්ඩාර වලව්ව වෙත පිටව ගියේය. උදව්වක් බලාපොරොත්තුවෙන් හිස් අතින් යා නොහැකි නිසාවෙන්දෝ ඔහු තම මෑණියන් පොදිබැඳ දුන් රසකැවිලි පොදියද එහි රැගෙන යාමට අමතක නොකළේය. බණ්ඩාර වලව්වේ මිදුලෙහි කාරය නතර කරනා විට සෙල්ලම් බත් උයමින් සිටි එකියක් කෑමොර දෙමින් වලව්ව තුලට දිව ගියාය.

"මොකැ පොඩ්ඩියේ මේ මහසොහොන් අවතාරයක් දැකලා වගේ කෑමොර දෙන්නේ ?" වලව්වේ සිට ඈතමෙක් දිවගිය දැරියගෙන් විමසුවේය.

"අප්පුච්චි කවුදෝ එනවා ! අර....." ළදැරිය අනුර දෙසට අත දිගුකරමින් කීවාය.

"අනේ පොඩ්ඩියේ උඹ මේ බයවෙලා තියෙන්නේ අනුර අයියණ්ඩිටනේ !" බණ්ඩාර නිලමේ තම දියණියගේ හිසට තට්ටු කරමින් කීවේය. "අනුර පුතා උඹ දැක්කකල්, උඹට තුණුරුවන්ගේ සරණයි !" ඔහු අනුරට ආශිර්වාද කළේය.

"මාමණ්ඩි !" අනුර තමා ගෙන ආ කැවිලි පොදිය බණ්ඩාර නිලමේට පිළිගැන්වූවේය.

"තෑගිබෝග මක්කටැයි පුතේ, ඇතුලට ඇවිදින් ඈදිගමුකෝ !"

"කොයි මාමණ්ඩි, නැන්දම්මා ?" අනුර වලව්වට ඇතුළු වෙමින් විමසුවේය.

"මැණිකේ පන්සලට ගොහින් ! අද අපිට හීල් දානේ."

“මාමණ්ඩි මං මේ තකහනියක් ආවේ උපකාරයක් බලාපොරොත්තුවෙන්”

“මක්කද පුතා මගෙන් වෙන්ට උවමනා උපකාරය ?”

“හෙට සිරිමල්ගෙ ණඩු විභාග දවස !”

“හැබෑද !, ඉතිං පුතා ආපු කාරණාව !”

“මාමණ්ඩි නොදන්න කාරණාවක් තියෙනවා. මේ ගම් තුලානේ එකාලා සිරිමල්ව පට්ටපල් හොරෙක් ගාණට දැම්මාට උඹ ඒ දේවල් කරේ උගේ මනාපෙට නෙවෙයි! උගේ අප්පා සියදේරිස්ගෙ බලකිරිල්ලට. මං ඒ වගක් දන්නේ අද ඊයෙක නෙවෙයි මාමණ්ඩි, මං ගමෙන් යන්ටත් පෙරින් ඉඳන් !”

“උඹ කියන්නේ අප්පුගේ මළගමට උගෙ සම්බන්ධයක් නැතිවගද ?”

“හැබෑව, ඒ වුණත් මාමණ්ඩිගේ වලව්ව බිඳිල්ලට නම් උගෙ සම්බන්ධයක් නෑය කියන්ට මට බෑ. ඒ වරදට නෙවැ උඹට මේ දෙතුන් මාසයක් හිරගෙදර ළඟින්ට වුනේ. හැබැයි මාමණ්ඩි තව කාරණාවක් තියෙනවා.”

“තව කාරණාවක් ?”

“හෙට නඩුවේදි, සිරිමල්ට අප්පුගේ මළගමට සම්බන්ධයක් නැතිවග ණඩුකාර උන්නාන්සේට ඔප්පු නොකෙරුවොත් සිරිමල්ට වෙන්නේ උගේ අප්පගෙ ඉරණාමමයි !” අනුර සුසුමක් හෙළමින් කීවේය. “මං මේ මාමණ්ඩිගෙන් උපකාරයක් ඉල්ලන්නේ නෑ කමකටමත්ම නෙවෙයි, සිරිමල්ගේ පාර්ශවේ පිස්කල් හැටියට !”

“පිස්කල් හැටියටය කිව්වා ?”

"ඔව් මාමණ්ඩි මං එංගලන්තේ ගොහින් නීති විශාරද උපාධිය ගත්තා. මං එහෙත් ටික කාලයක් පිස්කල් කෙනෙක් විදියට වැඩ කළා."

"පුතා උඹනම් හරි දස්සයෙක් ! කාගෙවත් ඇස්වහක් කටවහක් නම් උඹට වැදෙන්ට එපා. ගමේ එකාලගේ කටවල් හින්දා නොවැ සිරිමල් කොලුවට මෙච්චර වින්නැහියක් වුණේ. අපේ ඇස් ඇරෙව්වාට උඹට පින් සිද්ධ වෙනවා පුතේ. තව ජුංඩක් එහෙමෙහෙ උනානම් හෙට සිරිමල් කොලුවාට නිස්කාරණේ හිරේ ළඟින්ට වෙනවා."

"හැබෑට මාමණ්ඩි කවුද මේ නඩුව දැම්මේ ?"

"අප්පු කියන්නේ පිටගම්කාරයෙක් නෙවැ. උන්ගේ ගමේ ආරච්චිල අපි එක්කල එතරම් හිත හොඳ නෑ.

දන්නවානේ පුතා උන් එක්කලා තියෙන පරණ කෝන්තර ගැන. අපි ඥාති වග උනුත් දන්නවා නෙවැ. ඒ පරණ කොන්තර හන්දා එපිට ගමේ ආරච්චිල තමයි නඩුව දාලා තියෙන්නේ."

"මාමණ්ඩිට හැකි නේද සිරිමල්ට හෙට උසාවියේදි නිර්දෝෂීවගට සාක්ෂි දෙන්ට" එතකොට අපිට මේ නවනිංගිරාවන් අකාමකා ගන්ට හැකිවෙයි."

"උඹ කීවත් නොකීවත් මං හෙට සෙංකඩගල යන්ට එනවා."

"මාමණ්ඩි හෙට අලුයම් දුරේ කඩමණ්ඩිය ගාවට එන්න හැකියි නම් අපි එක්කලාම කාර් එකෙන් ගමන යතහැකියි."

"එහෙනම් අලුයම් දූරේ කඩමණ්ඩිය ගාව ඉන්නම්"

********

"පුතණ්ඩියෝ කොතෙන්ටද බණ්ඩාර මාමණ්ඩි එනවාය කිව්වේ" ආරච්චිල තම පුතණ්ඩියාගෙන් විමසුවේය.

"මාමණ්ඩි කඩමණ්ඩිය ගාව ඉන්නම්ය කිව්වා. මතක්කරා විතරයි අර ඉන්නේ බණ්ඩාර මාමණ්ඩි !" අනුර ඉදිරිය දෙස බලමින් කීවේය. කාරය කඩමණ්ඩිය අසල නැවැත්වීය. බණ්ඩාර නිළමේද සෙංකඩගල ගමනට එක්වූයේය. හෝරා ගණනාවක ගමනකින් අනතුරුව ඔවුන් සෙංකඩගලට පැමිණියහ. කාරය දළදා මැදුර පසුකර යනවිට සියල්ලන් අසුනින් ඉස්සී දළදා පිහිට පතන්නට වූහ.

"පුතණ්ඩියා උසාවියට තව කොච්චර දුරද ?"

"තව හුවකදුරක් විතර ඇති මයෙ හිතේ !" අනුර පිළිතුර දුන්නේය.

නඩුව විභාග වෙයි.

සියල්ලන්ම උසාවිය වෙත නික්මුණහ. ඔවුන් සියල්ලන්ම බලා උන්නේ සිරිමල්ගේ පැමිණීම බලාපොරොත්තුවෙනි.

"අනුර පුතා මොකෑ මෙච්චර සිරිමල් එන්ට පරමාද වෙන්නේ ?"

"හිටින්ටකෝ මාමණ්ඩි, මං අර පොලිස් රාළහාමිගෙන් විමසලා එඥ්ඥම්" අනුර පසෙක අසුන්ගෙන සිටි පොලිස් රාළහාමි වෙත ගොස් සිරිමල් පිළිබඳ විමසුවේය.

"පිස්කල් මහත්තයා කලබල වෙන්ට කාරි නෑ වෙලාවට කලාවට අර එන්නේ උන්දෑ" රාළහාමි එතැනට පැමිණි සිරිමල්ව පෙන්වමින් අනුරට කීවේය. අනුර සිරිමල් වෙත ගියේය.

"උඹ ආවා එහෙනම් !"

"මට හරි කුකුසසි අනුර, උඹට හැකි වෙයිද මාව හිරෙන් නිදහස් කරගන්ට?"

"උඹට මාව විශ්වාස නැතිද සිරිමල් ?"

"මං අනුරට නොකිව්වට මෙච්චර දොහක් උඹ එනකල් මඟ බලාගෙන උන්නේ !"

"දළද හාමුදුරුවන්ගේ පිහිටෙන් හැමදේ ගැනම ශුභවාදීව හිතපන්." අනුර කිව්වේය. "අන්න දැන් අපිට නඩු විභාගෙට කතා කරන්ටයි සූජානම"

********

නඩු විභාගය ආරම්භ විය. මුලින්ම පැමිණිලිකාර පාර්ශවයේ අවස්ථාව විය. නඩුවෙහි පැමිණිලිකරු වූ එපිට ගමේ ආරච්චිල හා පිස්කල් සිරිමල්ට විරුද්ධව නොයෙකුත් කරුණු කාරණා පැවසුහ. අනතුරුව උදාවූයේ විත්තිකාර පාර්ශවයේ අවස්ථාවයි. නඩුකාර උන්නාන්සේ අනුරට ඇමතුවේය.

"මීළඟට විත්තිකාර පාර්ශවයේ අවස්ථාවයි. විත්තිකරුට පක්ෂව සාක්ෂි ඉදිරිපත් කරන්ට හැකියි."

අනුර තම අසුනින් නැගී සිටියේය.

"ස්වාමීනි විත්තිකරුවන සිරිමල් ගුණරත්නගේ නිර්දෝෂිභාවය ඔප්පු කිරීමට සාක්ෂිකරුවකු ඉදිරිපත් කිරීමට අවසරයි."

"උසාවිය ඒ සඳහා අවසර දෙනවා !"

"ඒ.පී. බණ්ඩාර මහතාව සාක්ෂි කූඩුවට කැඳවනු ලබනවා."

උනුරගේ නිවේදනයෙන් ඉක්බිතිව බණ්ඩාර නිළමේ සාක්ෂි කූඩුව වෙත ගියේය. අනුර යළිත් නඩුකාර උන්නාන්සේව ඇමතුවේය.

"ස්වාමීනි උසාවියට ඉදිරිපත් කිරීමට වැදගත් කාරණාවක් තියෙනවා. සිරිමල් කියන්නේ මගෙ ළඟම ඥාතියෙක්. !"

"මොකක්ද තියෙන ඥාතීත්වය ?"

"මගේ මවගේ එකම සහෝදරියගේ පුතා !"

"ඔබ උසාවිය ඉදිරියේ ඔප්පුකරන්ට යන කාරණාව මොකක්ද ?"

"සිරිමල් සම්බන්ධයි කියන සිද්ධිය සිද්ධවුණෝ මේ බණ්ඩාර මහත්තයාගේ වලව්වේදි. බණ්ඩාර මහත්මයා එදා වෙච්චි සිදුවීම උසාවිය ඉදිරියේ විස්තර කරානම් !" අනුර බණ්ඩාර නිළමේ වෙත හැරී කීවේය. අනුරගේ ආයාචනය පිළිගත් හෙතෙම උසාවිය ඉදිරියේ එදින සිදු වූ සිදුවීම විස්තර කළේය.

"ඔබ එයින් අදහස් කරනුයේ විත්තිකරු, ගුණරත්න අප්පුහාමිගේ මරණයට සම්බන්ධ නොවූ කාරණාවද ?" නඩුකාරයා විමසුවේය.

"එහෙමයි ස්වාමීනි !"

"මීළඟට විත්තිකරු සිරිමල් ගුණරත්නව සාක්ෂි කූඩුවට කැඳවනවා." නඩුකාරයා නියෝග කළේය. බණ්ඩාර නිළමේ සාක්ෂි කූඩුවෙන් පිටව ගිය අතර වාරයේ සිරිමල් සාක්ෂි කූඩුව වෙත පැමිණියේය. පැමිණිලිකාර පාර්ශවයේ පිස්කල් තම අසුනින් නැගී සිටියේය.

"ස්වාමීනි, විත්තිකරුගේ ප්‍රශ්න කිරීමට ගරු උසාවියෙන් අවසර !" ඔහු කීවේය.

“අවසර ලැබෙනවා!”

“එදා සිද්ධි වෙච්ච දවසේ තමන් වලච්ච බින්ඳ බවට පිළිගන්නවාද ?”

“එහෙමයි ස්වාමීනි!”

“අප්පුහාමිගේ මරණය තමන් සම්බන්ධ නැතිද ?”

“එහෙමයි ස්වාමීනි, එදා අප්පුහාමිට ගිනි බටේ පත්තු කෙරුවෙ මං නෙවෙයි, මගෙ අප්පොච්චා සියදේරිස් !”

“තමුන් එදා හොරකමේ යාමට හේතුවක් තියෙනවාද ?”

“එහෙමයි ස්වාමීනි !, මං පාසල් යන කාලයේ ඉඳන්ම හොරකම් කෙරුවා, ඒත් ඒ මගෙ මනාපෙට නෙවෙයි. මගෙ අප්පොච්චිගෙ බල කිරිල්ලට”

“තමුන්ට ඒකට සාක්ෂි ඉදිරිපත් කළ හැකිද ?” මෙතෙක් නිහඬව සිටි නඩුකාරයා විමසුවේය.

“එහෙමයි ස්වාමීනි, ඒකට හොඳම සාක්ෂිකරු අනුර, ඒ කියන්නේ අපේ පිස්කල් මහත්තයා. අපි හොඳම මිතුරන් වගේම ළගම ඥාතීන්. ඒ හැම කාරණාවක් ගැනම පිස්කල් මහත්තයා දන්නවා !”

මෙතෙක් වෙලා අසුන්ගෙන සිටි අනුර යළිත් තම අසුනින් නැගී සිටියේය.

“විත්තිකරු සිරිමල්ගේ ප්‍රකාශය සත්‍යයයි ස්වාමීනි ! මගේ පාසල් යන වයසේ ඉඳලම මම දන්නවා ඒ කාරණාව ගැන. ස්වාමීනි ඔබතුමාට අවශ්‍යනම් ඒ කාරණාව තවදුරටත් ඔප්පු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ හැකියි.”

"තවදුරටත් සාක්ෂි අවශ්‍ය නොවේ. නඩු තීන්දුව ලබාදීමට පෙරින් ගරු උසාවිය අඩ හෝරාවකට කල් දමනවා." නඩුකාර උන්නාන්සේගේ නියෝගයෙන් සියල්ලන්ම නැගී සිටියහ.

********

අඩ හෝරාවකට පසු උසාවියේ වැඩ කටයුතු යළිත් ආරම්භ විය. සියල්ලන්ම උනන්දු වූයේ නඩු තීන්දුව බලාපොරොත්තුවෙනි.

"ගරු උසාවිය නඩු තීන්දුවල ලබාදීමටයි සූදානම. අද දින ලබාදුන් සාක්ෂි හා සාකච්ඡා කළ කරුණු අනුව විත්තිකරු සිරිමල් ගුණරත්න,

අප්පුහාමි නම් තැනැත්තාගේ මරණයට සම්බන්ධ නොවන බව පෙනී යයි. ඒ අනුව ගරු උසාවිය තීරණය කොට තිබෙන්නේ එල්ල වී ඇති චෝදනා වලින් හා නඩුවෙන් ඔහුව නිදොස් කොට නිදහස් කිරීමටයි. ඒ අනුව සිරිමල් ගුණරත්නගේ නිර්දෝශීභාවය ඔප්පු වේ. දැන් උසාවියේ කටයුතු අවසන් වේ."

********

නඩු විභාගය අවසන් වූ වහාම අනුර හා සිරිමල් තම භාරයන් ඔප්පු කිරීමට දළදා මැදුර වැදපුදා ගැනීමට ගියහ. අනතුරුව ඔවුන්ගේ අදහස වූයේ වසර ගණනාවකට පසු සතුටු සාමිච්චියේ යෙදීමටයි. හිරු බැසයමින් තිබුණු හෙයින් කිරි මුහුදට අමුතු රූපශ්‍රියක් ආරූඪ වී තිබිණ. බටහිර අහසේ ගුරුබා තිබුණේ නෙක නෙක රූ රටා මවමිනි. මෙම සියලුම සුන්දරත්වයන් කළඑළි වී තිබුණේ හිරෙන් නිදහස් වූ සිරිමල්ව පිළිගැනීමට මෙනි. අනුර හා සිරිමල් මෙම දසුන් රස විඳිමින් වැව රවුම දිගේ ඇවිද යමින් සිටියහ.

"ඉතිං සිරිමල් උඹට සන්තෝස නැතිද හිරෙන් ගැලවුණාට ?" අනුර සිරිමල්ගෙන් විමසුවේය.

"උඹට පින්සිද්ධ වෙන්ට තමා මට, ආයෙත් ගම් බිම් බලා යන්න හැකිවෙන්නේ. ඒ වුණාට මට තියෙන පුරස්නේ ගමේ එකාලා මං හිරෙන් ගැළවුණාට විස්සෝප වෙයිද කියන කාරණාව. ?"

"උන් හූල්ලලා හූල්ලලා බැරිම තැන කරබගනිවී" අනුර කීවේය.

"උඹට කියන්ට පිස්කල් උන්නැහෙ මං හිතාන උන්නේ හිරෙන් ගැලවෙන්ට බැරි උනොතින් නියඟලා අල කාලා පණ නහගන්ට."

"උඹට ඔල්මාදේද සිරිමල් ?" අනුර සිරිමල්ගෙන් විමසුවේය. "උඹ ආයිත් වංගියක් මට පිස්කල් උන්නැහේ කිව්වොතින් මං උඹට තලන්නේ ඉලපතෙන්!"

"නොදකින් විතරක් උඹලට ගරු නම්බුදීල කතා කළත් වැරදියි !" සිරිමල් තමාටම මුමුණාගත්තේය.

"මොකක්ද උඹ දෙඩුවේ ?"

"මක්කවත් නෑ"

"සිරිමල් උඹට තවත් කාරණාවක් කියන්ට තියෙනවා!"

"ඒ මක්කද ?"

"පුංචි අම්මා මේ දොහේ උන්නේ ඩිංගිත්තක් විතර හොන්දු මාන්දුවෙලා. උඹ බංගලාවට ගියායින් ඒ ගතිය ඇරිලා යාවි !"

"අනුර අපි දැන්මම වලව්වට පිටවෙනවාද ?"

“දැන්මම ගියත් යනකොට හෙට අලුයම් දූරේවත් වෙයි. ඒ හින්දා මං තීරණය කළේ අද රාත්තිරිය රැපිණ බංගලාවේ ගතකරලා හෙට උදෑහනැක්කේම දුම්බරට පිටවෙන්ට”

“රැපිණ බංගලාවේ රැයගත කළොතින් අපිට අපිවම විකුණාගෙන තමා කන්ට වෙන්නේ.”

“සිරිමල් උඹ විස්සෝප වෙන්ට උවමනා නෑ. මං ගාව මුදල් හදල් තියෙනවා.”

“හැබෑද ?”

“හත්තිලව්වේ, ඇඳිරි වැටීගෙනත් එනවා. සිරිමල් අපි ආපිට යමු.” අනුර කීවේය.

********

රැපින බංගලාවේ රැය ගත කළ ඔවුහු පසුදා උදැහනැක්කේම තම ගම් බිම් බලා පිටවූහ. කාරය ආරච්චිල වලව්ව වෙත ඇදෙන්නට විය. බොරළු පාර දිගේ ඇදී යන කාරය දෙස මඟ දෙපස වූවෝ හැරී බලන්නට විය. බණ්ඩාර නිළමේ කඩමණ්ඩිය අසළින් බැස යන්නට සූදානම් වූයේය.

“පුතණ්ඩියා මාව ඔය කඩමණ්ඩිය ගාවින් බස්සලා යන්ට”

“මාමණ්ඩිට හැකිනෙවැ දවල්ටත් සප්පායම් වෙලාම යන්ට.”

“නෑ පුතණ්ඩියා අද රාජකාරි කටයුත්තක් තියෙනවා. මං කරත්තෙකින් වලව්වට යන්නම්”

"හොඳා මාමණ්ඩි, මාමණ්ඩිගෙ කැමැත්තක්. මාමාණ්ඩි කරපු උපකාරෙට පින් සිද්ධ වෙනවා."

**අලුත් කාලයක් !**

ඇඳිරි වැටෙන යාමයේ, ආරච්චිල වලව්වේ ඇත්තෝ තේ සප්පායම් වෙමින් සිටියහ.

"පුතණ්ඩියෝ මෙන්න උඹට අප්පච්චි වැදගත් කාරණාවක් කියන්ට අඬගහනවා. මෙහෙට ඩිංගිත්තක් ආවනම්" ආරච්චිල මැණිකේ අනුරට හඬගෑවාය.

"ඇයි අප්පච්චි?" අනුර එදෙසට පැමිණෙමින් විමසුවේ.

"මෙහෙන් ඇඳි ගනින්කෝ !"

"මොකක්ද අප්පච්චි කාරණාව ?"

"මතකද වංගියක් මං උඹට කිව්වා කවදාහරි දොහොක උඹට මේ ආරච්චිල පට්ටම උරුමවෙන වග ?" අනුර ඊට එකඟ වෙමින් හිස සැලුවේය.

"මමත් දැන් හණමිටි කාරයෙක් නෙවැ. ගමේ එකාලත් මනාප ඇති උඹ වගේ උගතෙකුට. ඒ හන්දා පුතේ මගේ තීරණයේ මේ දොහේ මේ ආරච්චිල පට්ටම උඹට භාරදෙන්ට. උඹ ඒකට මනාපයිද පුතේ ?" ආරච්චිල විමසුවේය.

"මං ඒ කාරණාව ගැන අප්පච්චිට ඩිංගිත්තක් කල්පනා කරලාම කියන්නම්කෝ"

"ඔන්න පුතේ උඹලගේ අම්මණ්ඩිට තවත් කාරණාවක් උඹ එක්කල දොඩන්ට තියෙනවාලු ?" ආරච්චිල මැණිකෙගේ මලයණ්ඩි එම කාරණාවට මුලපුරමින් පැවසුවේය.

“මොකක්ද අපෙ අම්මා ඒ කාරණාව”

“උඹ අහල තියෙනවාද දුම්බර පලාතේ මුහන්දිරම් වලව්ව ගැන. ඒ මුහන්දිරම් වලව්වේ නිලමෙලාගේ හත්මුතු පරම්පරාවම ඉස්සර රාජාධිරාජසිංහ දෙයියන්ගේ කාලේ ඉඳලම කන්දේ නුවර රාජ සභාවේ බලපුළුවන්කාර ඇත්තෝ දැන් මුහන්දිරම් නිලමෙගේ අප්පොච්චා ඒ දොහෝ ඒ කියන්නේ රාජසිංහ දෙයියොන්ගෙන් වංගියක් පුද පඬුරු වශයෙන් ගම්වරයක් ලබාගත්තාලු.”

“ඉතිං අම්මා මොකෝ මේ ඒ ඇත්තොන්ගේ බලපුළුවන්කාරකම් මා එක්කලා දොඩන්නේ.”

“මයෙ පුතේ උඹෙ කලවයසත් හරි මයෙ හිතේ දැන් කරකාර බඳින්ට. මයෙ අදහස නම් මං අර පෙරින් උඹ එක්කල දෙඩුව මුහන්දිරම් වලව්වෙ රන්මැණිකෙව උඹට අගේට ගැළපෙන වග. උඹ දැන්ම ඒ ගැන තීන්දු කරන්ට උවමනා නෑ. ටික දොහක් හිතලා පතලා උඹේ අදහස කියහන්කෝ. එහෙම හොඳා නේද අපෙ නිළමේ ?”

“මැණිකෙගෙ අදහසට අපිත් මනාපයි !” ආරච්චිල කීවේය.

********

“අනුර මහත්තයෝ ඔහොම ඩිංගිත්තක් හිටින්ටකෝ.” වැව් ඉවුරේ ඇවිදගිය අනුරට ඇතමෙක් හඬ ගැසීය. අනුර පිටුපසට හැරී බැලුවේය.

“අනේ අනේ සිරිමල් ! මං උඹට වංගියකුත් කිව්වා නෙවැ ඔය ගරු නම්බු තානාන්තර දීලා මාව විහිළුවකට ගන්ට එපාය කියලා. මේ දොහේ නම් මං උඹව වැවට පතබාවනවා.”

"හා හා උඹ මොකෑ මේ වෙසමුනියා ආවේස කරන් වගේ ? මට උඹෙන් කාරණාවක් අහන්ට තියෙනවා."

"ඒ මක්කැයි ?"

"මට ලොකු අප්පොච්චා කිව්වා උඹ මුහන්දිරම් වලව්වේ රන්මැණිකෙව සහේට ගන්ට මනාපයිය කියලා."

"ඒ කාරණාව නම් හැබෑව! ඒත් දැන් උඹ මක්කැයි කරන්ට හිතන් ඉන්නේ සිරිමල් ?"

"ඒ කාරණාව තමා බං මට හෙනේට තියෙන්නේ."

"මට හැකි උඹට උපකාරයක් කරන්ට. මගේ අදහසක් තියෙනවා දුම්බර ලාක්ෂා පැදුරු කර්මාන්තසාලාවක් හදන්ට. උඹට හැකි නෙවැ ඒක කරගෙනයන්ට."

"ඒ මොකක්ද බං ඔය කර්මාන්ත ශාලාවක්ය කියන්නේ ?"

"උඹ හිතාගනින්කෝ ඒක අපේ කඩමණ්ඩිය වගේය කියලා."

********

**මඟුල් කෑම**

"ගොයියනේ මේ වංගියේ නම් අටුකොටු පිරෙන්ට අස්වනු නෙළත හැකියි. මං හිතන්නේ වැස්සවලාහක දෙයියෝ මේ දොහේ මුළු ගමටම ආශිර්වාද කරලා ඕං"

"මගේ අදහස නම් උක්කුවෝ මේ වැස්සවලාහක දෙයියොන්ගේම හාස්කමක් නෙවෙයි බං පුංචි නිලමේ ගම්රට බලා ආවායින් පස්සේ තමා අපේ ගම් තුලාවට කරල පහුනේ. උඹලට ආරංචි නැතුවාද බං මුහන්දිරම් වලව්වේ මැණිකෙට අපේ පුංචි නිලමෙව තීන්දු කරලාලු බං!"

"ඒ කාරණාව හැබෑව. අපේ හාමිනෙත් අද උදැහනැක්කේ බංකු රබාන පදම් කර කර දැගලුවේ. උන්දැ තව කාරණාවක් කිව්වා. මංගල්ලෙ දාට ආරච්චිල පට්ටම පුංචි නිලමෙට පවරනවාලු ඕං. මංගල්ලෙත් හෙට අනිද්දා දිහාට තියෙනවාලු"

"මමනම් දැනන් උන්නේ ඉන්තේරුවෙන්ම ආරච්චිල පට්ටම පුංචි නිලමෙට පවරන කාරණාව ගැන."

වෙල්යායේ නියර දිගේ දොඩමළු වෙමින් පැමිණි ගැමියෝ බොරළු පාර දිගේ ඇදී එන කාරය දැක එදෙස නැවතී බලා සිටියහ.

"අර රෝද හතරනම් පුංචි නිලමේගේ වෙන්ට බෑ."

"ඒක සුද්දෙක් නෙවැ එලවන්නේ !"

කාරය ගැමියන් අසල නතර විය.

"කොහොමද යන්නේ අනුරගේ වලව්වට" සුද්දා නුහුරු සිංහල බසින් දෙඩුවේය.

"ඔය දොඩන්නේ පුංචි නිළමේ ගැන වෙන්ටැති. එක් ගැමියෙකු අනෙකාගේ කනට කොඳුරා කීවේය.

"ඔය මහත්තයා මේ පාර දිගේම ගියොත් ආරච්චිල වලව්ව මුලිච්චි වේවි" එක් ගැමියෙකු ගරුසරු ඇතිව කීවේය.

"තෑන්ක්ස්" එසේ ස්තූති කළ සුද්දා කාරය පණගන්වා ඉදිරියට ඇඳුනේය.

"හැබෑට බං ඒ සුද්දා අපිටත් වඩා පංකාදුවට සිංහලෙන් දෙඩෙව්වේ."

********

සිරිමල් හා අනුර වලව්වේ ආලින්දයට වී ලාක්ෂා පැදුරු කර්මාන්තශාලාව පිළිබඳ සැලසුම් කරමින් සිටියහ. කාරයක් විත් වලව්ව ඉදිරිපිට නතර විය. ඔවුහු මවිත වෙමින් අමුත්තා දැන් වලව්වට පැමිණේවි, දැන් වලව්වට පැමිණේවි කියා බලා හිඳින්ට වූහ.

"අනුර බලාපන්, අර එන්නේ සුද්දෙක් නේද ?"

"සුද්දෙක් ?" එසේ කියූ අනුර කවිච්චියෙන් නැගී සිටියේය.

"හෙලෝ අනුර !" අමුත්තා අනුරට අතට අත දුන්නේය.

"මේ රොබින් නෙවැ ! හෙලෝ රොබින් !" අනුර ඔහුව සාදරයෙන් පිළිගත්තේය.

"එන්න රොබින් ! ඇතුලට ඇවිදින් ඇදි ගත්තානම්! රොබින්, මේ ඉන්නේ සිරිමල් !"

"හායි සිරිමල් !" රොබින් සිරිමල්වද පිළිගත්තේය.

"රොබින් උඹ කොහොමෙයි, වලව්වට එන පාර දැනගත්තේ ?"

"උඹ පෙරින් කියලා තිබ්බ විදියට තමයි මං ආවේ."

"සිරිසෝමයි, ඩේවිඩ් අන්කලුයි බංගලාවේද ?"

"ඩැඩී, ත්‍රී මන්ත්ස්වලට ඉන්ග්ලන්ඩ් ගියා. සිරිසෝම බංගලාවේ නැවතුනා."

"හැබෑද ?"

********

"රොබින් පුතා මෙහෙ එන වග කලින් ආරංචි වුණා නම් කටට රහට කෑම ඩිංගිත්තක් සූජානම් කරන්ට තිබුණා." ආරච්චිල මැණිකේ පසුදින උදෑසන පාතරාසයේදි මැසිවිලි නැගුවාය.

"ඔය ළමයාට අද උදැහනැක්කේම කොළොම්පුරේ නොගිහින් තව ටික දොහක් ඉඳලා යතහැකි නෙවැ. අනුර පුතා උඹ එක්කලා දෙඩුවේ නැතිද අනිද්දට කෙරෙන්ට යන කාරණාව ගැන ?" ආරච්චිල නිළමේ විමසුවේය.

"නෝ අන්කල් ! මට කිව්වේ නෑ" රොබින් සිංහලට නුහුරු බසින් කීවේය.

"එහෙනම් පුතාම ගොහින් ඇහැව්වානම් හොසයි අපේ පුතණ්ඩියාගෙන්, ඒ කාරණාව ගැන !"

ආරච්චිල මැණිකෙගේ උපදෙස අනුව උදෑසන ආහාර කිස ගෙන රොබින් අනුර වෙත ගියේය.

“අනුර ඔයාගේ මමී මට කියව්වා තව දවස් දෙකකින් වලව්වේ වැදගත් කාරණාවක් කෙරෙන්ට යනවාය කියලා. මොකක්ද ඒ කාරණාව ?”

“රොබින් අහන්නේ ඒ කාරණාව මක්කද කියල නෙවැ. මගේ මංගල්ලේ එදාට පවත්වන්නට තීන්දු කරලා තියෙන්නේ. මුහන්දිරම් වලව්වේ රන්මැණිකේව මං සහේට ගන්ටයි සූදානම”

“අනුර මට ඒ කාරණාව කියන්ට ලේට් උණෝ ඇයි ?”

“මං රොබින්ට ඒ කාරණාව ගැන කියන්ටයි හිතාන උන්නේ ! හැබැයි ඕං අදනම් කොළොම්පුරේට පය තියන්ට හිතන්ටවත් එපා. රොබින් ඉන්නේරුවෙන්ම මගේ මංගල්ලේ දා වෙනකල් වලව්වෙම රැදෙන්ට උවමනයි.

“හොඳයි”

**නික්මයාම**

"උඹ මේ කොහෙ යන ගමන්ද හීන්බණ්ඩෝ ?"

"මං මේ පිස්කල් ආරච්චිලව මුලිච්චි වෙන්ට යන ගමන් !"

"ඒ මොන ගරු නම්බු තානාන්තරයක්ද බං ඒ ?"

"මේ ගමේ එකාලගේ නඩුහබ විසඳන්ටයි ගමේ එකාලගෙ නැතිබැරිකම් පිරිමහන්ටයි වෑයම් කරන උත්තමයෙකුට ඒ ගරු නම්බුව වැරදි එකක්ද බං ?"

"උඹේ කාරණාව හැබෑව ! උඹ මක්කටැයි මේ උදැහනැක්කෙක් වලව්වට ගාටන්නේ ?"

"ආරච්චිල නිළමෙයි, පොඩි මැණිකෙයි මනාපයි වරකා කන්ට. ඒ විතරක්යැ තාම කිරිසප්පයා වුණාට නිලමෙගේ දරුවාත් බොහොම මනාපයි ඒවලට. අපේ හාමිනේගෙන් එක දොහක් ඉල්ලලා තිබුණා පොඩි මැණිකේ වරකා පංගුවක්. මං ගොහින් දීලා එශද්ශදන්කෝ උක්කුවා."

"හොඳා, උඹට සුනන්ංගු වෙනවානේ පලයන්."

********

ලලිතා වූයේ මිදුලට වී පන් පැදුරක් වියමින්ය.

"පැංචියේ, ඩිංගිත්තක් මෙහෙට වරෙන් !"

"ඇයි අක්කණ්ඩි ?"

“උඹ ගොහින් කිරි අම්මාගෙන් අහල වරෙන් පන් පැදුර වියලා අහවරද කියලා.”

“මං එනකොට කිරි අම්මා පැදුර වියලා අහවර කලා.”

“එහෙනම් උඹ කියලා වරෙන් සිරිමල් මහත්තයාට පැදුරු ටික විකුණන්ට ලක්සලට යන්ට උවමනානම් දැන්මම එන්ටය කියලා.”

“මං ගොහින් එන්නම්කෝ අක්කණ්ඩි.”

********

කාලයාගේ ඇවෑමෙන් අනුර ගම්තුලානට සේවය කරන කාරුණික වූ ආරච්චි නිලමේ වරයෙක් විය. සිරිමල්ද අනුර තමාට පැවරූ රාජකාරිය මනාව ඉටුකරමි සිටියේය. රොබින් තම මව් රටවන එංගලන්තය වෙත ගියේය.”

# ස්තූතිය


මා හට සාහිත්‍ය නිර්මාණකරණය කිරීමේ හැකියාව හිමි වූයේ නිරතුරුවම විෂයභාර පොතපත කියවීම නිසාවෙනි යැයි මම සිතමි. ඉතියෙන් ප්‍රථමයෙන් කුඩා කල සිටම විෂය බාහිර පොතපත කියවීමට මා යොමු කල අම්මාටත් අප්පච්චිටත් මාගේ හදපිරි ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

මා හට පෙර පාසලේ සිට මේ දක්වා අධ්‍යාපනය ලබාදුන් ගුරු මැණිවරුන් හා ගුරු පියවරුන්ට මා බෙහෙවින්ම ස්තූතිවන්ත වෙමි.

මහනුවර ගෝතමී බාලිකා විද්‍යාලයේ අධ්‍යාපනය හදාරණ සමයේ මෙම ග්‍රන්ථය රචනා කිරීමට මා හට බෙහෙවින් උපකාර කළ නිලුක්ෂි රාජපක්ෂ ගුරුතුමියටත් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයීය විද්‍යුත් පොත් රචනා කිරීමේ සංගමයේ නියමුවාණන් වන ගුරු විදුහල්පතිනි ශෂිකලා සේනාධීර ගුරු මැණියන්ටත් සෙනෙවිරත්න ගුරු පියාණන්ටත් මා බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

තවද මෙම ග්‍රන්ථයේ පිට කවරය සඳහා සිතුවම් නිර්මාණය කල මාගේ මිතුරිය වන තවිසි චිතේරා සොයුරියටත් මා හට නන් අයුරින් උපකාර කල සියලුම දෙනාටත් මාගේ හද පිරි ස්තූතිය පුද කර සිටිමි.



සේසතිනි දිල්මිණී යාලිංගසිංහ
අංක 134, අත්තරගම,
පට්ටියාවත්ත,
මහනුවර.
2023-10-19



**ISBN**
ISBN 978-624-206-609-7

**Bar Cade**
9 786242 066097